වාර්ෂික කාර්යසාධන වාර්තාව හා ගිණුම්

2019

රාජ්‍ය පරිපාලන

හා

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

නිදහස් චතුරශ්‍රය

කොළඹ 07

දුරකථන : 011-2696211-3
ෆැක්ස් : 011-2695279
ඊ-මේල් : info@pubad.gov.lk
අන්තර්ජාල ලිපිනය : www.pubad.gov.lk

ගරු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගේ සුභාශිංෂණය



රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් පසුගිය වසරේ. එනම් 2019 වසරේදී ඉටුකරන ලද කාර්ය සාධනය පිළිබඳව සමාලෝචන වාර්තාවක් ඉදිරිපත් කරන මේ සුවිශේෂී අවස්ථාවට, එම අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා වශයෙන් මගේ හෘදයාංගම සුභ පැතුම් පිරි නමමි.

පසුගිය වසර තුළදී ජනතාවාදී රාජ්‍ය සේවයක් සහතික කිරීමේ අරමුණින් අප අමාත්‍යාංශය විසින් මිලියන 20 කට අධික වූ මෙරටේ ජනතාව උදෙසා ඉටුකරන ලද සේවය ද, දීප ව්‍යාප්ත සේවාවන්හි සියළු නිලධාරින් පුහුණු කිරීම් සඳහා මෙන්ම පශ්චාත් උපාධි පුහුණුව විධිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් දක්වන ලද දායකත්වයද, එසේම විශ්‍රාමික රාජ්‍ය නිලධාරින්ගේ යහපත උදෙසා ප්‍රශස්ථ සේවාවක් සලසා දෙමින් සමාලෝචිත වර්ෂය තුළදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ඉටුකර ඇති කාර්ය භාරය හා ඉඩම් පිළිබඳ ලේඛණ ලියාපදිංචි කිරීම, නොතාරිස්වරු පත්කිරීම හා පාලනය කිරීමත්, උපත්, මරණ හා රෙජිස්ට්‍රාර්වරු පත්කිරීම හා ඊට අදාළ පරිපාලන කටයුතු විධිමත්ව සිදුකිරීම තුළින් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් ඉටුකරන ලද සේවාවන්ද සතුටින් අගය කරන අතර, එමගින් රාජ්‍ය සේවය ඵලදායි අන්දමින් ක්‍රියාත්මක කිරීම පිණිස මෙම අමාත්‍යාංශය විසින් අති විශාල දායකත්වයක් ලබාදී ඇති බවද, ප්‍රශංසාත්මකව සටහන් කරමි.

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් හා ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් එළි දක්වා ඇති සෞභාග්‍යයේ දැක්ම සංවර්ධන ක්‍රමෝපාය සැලැස්ම මගින් ඉදිරියේදී ආර්ථික ක්ෂේත්‍රයේ මෙන්ම, පරිපාලන ක්ෂේත්‍රයේ ද වේගවත් එමෙන්ම තිරසර වර්ධනයක් ස්ථාපිත කරගැනීමට අපි අපේක්ෂා කරන්නෙමු. එහෙයින් ගෙවීගිය 2019 වසරේ මෙම අමාත්‍යාංශයෙන් රාජකාරීමය වශයෙන් කිසියම් අතපසුවීමක් සිදුවී ඇත්නම්, ඒ සියල්ල හඳුනාගෙන ඉදිරි රාජ්‍ය යාන්ත්‍රණය වඩාත් ඵලදායි සහ කාර්යක්ෂම රාජ්‍ය යාන්ත්‍රණයක් බවට පත්කරීමට අප අමාත්‍යාංශයේ ලේකම්වරයා ප්‍රමුඛ අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයටත්, පොදුවේ සමස්ථ රාජ්‍ය නිලධාරි පිරිසටත් ශක්තිය, ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනය කරන අතර, සියළු දෙනාටම මගේ ප්‍රශංසාවද පළ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවුඩය



රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ 2019 මූල්‍ය වර්ෂයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම් වාර්තාව සඳහා පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම ඉමහත් සතුටට කරුණකි. මෙම අමාත්‍යාංශය සහ අමාත්‍යාංශය යටතේ පවත්නා සියළුම ආයතන මගින් 2019 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්, ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් මෙම වාර්තාව තුල අඩංගු වී ඇත.

2019 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරය විසින් වෙන් කරන ලද ප්‍රතිපාදන හා අරමුදල් ඵලදායීව හා කාර්යක්ෂමව මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන දැක්ම, මෙහෙවර, අරමුණු සහ කාර්යයන් හා කර්තව්‍යයන් මුල් කරගෙන එම වර්ෂයේ අපේක්ෂිත සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම පිණිස යොදවා ඇති බව සඳහන් කිරීමට කැමැත්තෙමි. රාජ්‍ය තන්ත්‍රය තුල යහපාලනය ප්‍රවර්ධනය කිරීමටත්, ඒ ඒ විෂයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමටත්, මානව සම්පත් කළමනාකරණය සහ පුහුණු කිරීමටත්, රාජ්‍ය සේවක නිල නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත්, ස්වභාවික විපත් හා මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන විපත් අවම කිරීම, ප්‍රතිචාර දැක්වීම ප්‍රතිසන්ධානය හා සහන සැලසීමේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය හා කළමනාකරණය කිරීමටත්, මෙම ප්‍රතිපාදන ප්‍රධාන වශයෙන්ම යොදාගෙන ඇත.

මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යයන් සාර්ථකව ඉටු කිරීමට හා ඉහල කාර්ය සාධන මට්ටමක් පවත්වාගෙන යාමට කැපවීමෙන් තම රාජකාරිය ඉටු කරන ලද අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරු, ප්‍රධාන මූල්‍ය නිලධාරී සහ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරු, අධ්‍යක්ෂවරු ඇතුළු කාර්ය මණ්ඩලයටත් අමාත්‍යාංශය යටතේ පවත්නා සියළුම ආයතන ප්‍රධානීන් හා කාර්ය මණ්ඩලවලටත්, දේශපාලන නායකත්වයටත් මාගේ කෘතඥතාවය පල කරමි.

එමෙන්ම නව රජයේ 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රත්පත්ති මාලාවට අනුව රටේ සංවර්ධනය සහ ජනතා අපේක්ෂාවන් මුදුන්පත් කිරීමට අප අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්ය හා කර්තව්‍යයන් සාර්ථකව ඉටුකරගෙන යාමට අවශ්‍ය සහයෝගය, මග පෙන්වීම හා උපදෙස් ලබා දීම සම්බන්ධයෙන් ගරු අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමාට මාගේ ස්තුතිය පුද කරන අතර, ඒ සඳහා සියළු කාර්ය මණ්ඩල වල කැපවීම ඉදිරියටත් අපේක්ෂා කරන බවද මෙහිදී කෘතවේදීව සඳහන් කිරීමට කැමැත්තෙමි.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

පටුන

*	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන ගරු.අමාත්‍යතුමාගේ පණිවිඩය	1
*	රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය	2
01	**ආයතනික පැතිකඩ**	
1.1	හැදින්වීම	3
1.2	දැක්ම, මෙහෙවර, අරමුණු, උපායමාර්ග	4
1.3	ප්‍රධාන කාර්යයන්	6
1.4	සංවිධාන ව්‍යුහය	8
02	**ප්‍රගතිය සහ ඉදිරි දැක්ම**	
2.1	2019 වසරේ වැදගත් සිදුවීම්	10 - 50
03	**වර්ෂය සඳහා සමස්ථ මූල්‍ය කාර්යසාධනය**	
3.1	මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය	52
3.2	අක්මුදල් ගැලපුම් ගිණුම	53
3.3	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	52
3.4	මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය	53
3.5	මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	54
3.6	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	55
3.7	ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	56
3.8	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	57
3.9	විගණකාධිපති වාර්තාව	
04	**කාර්ය සාධන දර්ශක**	59
4.1	ක්‍රියාකාරී සැලැස්ම මූලික කරගත් ආයතනික කාර්ය සාධන දර්ශක	61
	ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්ය සාධන දර්ශක (අංශ අනුව)	
	• ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවා අංශය	62
	• ශ්‍රී ලංකා පරිපාලන සේවා අංශය	65
	• ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා අංශය	68
	• ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා, තාක්ෂණික සේවා අංශය	75
	• ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවා අංශය	83
	• ඒකාබද්ධ සේවා අංශය	85
	• අභ්‍යන්තර පාලන අංශය	110

- නිවාස අංශය 111
- මානව සම්පත් සංවර්ධන අංශය 113
- සංවර්ධන අංශය 120
- මූල්‍ය අංශය 125
- ආයතන අංශය 130
- විමර්ශන, පර්යේෂණ හා මෙහෙයුම් අංශය 135
- තොරතුරු තාක්ෂණ අංශය 139
- විශ්‍රාම වැටුප් අංශය 143
- අභ්‍යන්තර විගණන අංශය 146
- කළමනාකරණ ප්‍රතිසංස්කරණ සහ මහජන සම්බන්ධතා අංශය 148
- ජාතික ඵලදායිතා ලේකම් කාර්යාල අංශය 154
- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව 164
- ආපදා කළමනාකරණ අංශය 173
- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව 205
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය 211

ප්‍රසම්පාදන සැලැස්ම- 2019 225

06 මානව සම්පත් සැලැස්ම

6.1 අනුමත සේවක සංඛ්‍යාව 2019 243

6.3 කාර්ය මණ්ඩලයේ හැකියා සංවර්ධනය 248

07 අනුකූලතා වාර්තාව 253

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

හැඳින්වීම

වර්ෂ 2019ක් වූ නොවැම්බර් මස 27 වන දින සිට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ලෙස නම් කරමින්, වර්තමානයේදී සියළු රාජ්‍ය ආයතන හා රාජ්‍ය සේවකයන් වෙත පරමාදර්ශී සේවාවක් සපයමින් කටයුතු කරන මෙම අමාත්‍යාංශයේ ඉතිහාසය වසර 84 ක තරම් දුරාතීතයකට විහිද පැතිර පවතී. මුදල් අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තුවක් ලෙස වර්ෂ 1931 ට පෙර පැවති මෙම අමාත්‍යාංශය වර්ෂ 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ වලින් පසු තේරීපත්වන ආණ්ඩු යටතේ විවිධ වෙනස්කම් වලට ලක්වෙමින් පැමිණ අද වන විට රාජ්‍ය පරිපාලනයේ විශිෂ්ඨ මෙහෙවරක නියැලෙමින් සිටිති.

රාජ්‍ය සේවක මහගෙදර වන මෙම අමාත්‍යාංශය සියළු රාජ්‍ය සේවකයන් සඳහා අවශ්‍ය මහපෙන්වීම මෙන්ම රාජ්‍ය සේවය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා සැලසුම් ගොඩනගමින් වර්තමාන යහපාලන මූලධර්ම මුදුන් පමුණුවා ගැනීමට මහත් කැපවීමෙන් කටයුතු කරනු ලබයි. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන, රාජ්‍ය පරිපාලනයේ ප්‍රමුඛයා වෙමින් ජනතා අපේක්ෂාවන්ට මුල් තැන ලබාදෙන රාජ්‍ය සේවයක් නිර්මාණය කිරීමට කටයුතු කරනු ලබයි. එහිදී රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, මානව සම්පත් කළමනාකරණය, ආයතනික සංවර්ධනය පෙරදැරි කොට ගෙන ක්‍රියාත්මක වන පුළුල් විෂය පථයක් සහිත සුවිශාල කාර්යය භාරයක් ඉටු කරන අමාත්‍යාංශයකි. ජාතික සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා දීප ව්‍යාප්ත සේවාවන් හා සමස්ත ඒකාබද්ධ සේවාවන්හි පරිපාලන කටයුතු සිදු කරමින් රාජ්‍ය සේවය තුළ මානව සම්පත වඩාත් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම මූලික පරමාර්ථය කරගනිමින් අමාත්‍යාංශය කටයුතු කරනු ලබයි.

රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 402 යටතේ සකස් කරන ලද රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ 2019 වාර්ෂික කාර්යසාධන වාර්තාව හා ගිණුම් මෙමගින් ඉදිරිපත් කෙරේ.

දැක්ම

දැයට විශිෂ්ඨ රාජ්‍ය සේවයක්

මෙහෙවර

මානව සම්පත නිසි පරිපාලනය, කළමනාකරණය හා
ප්‍රතිසංස්කරණය තුළින් විශිෂ්ඨ රාජ්‍ය සේවයක් තහවුරු කිරීම


අරමුණු

- රාජ්‍ය සේවයේ මානව සම්පත් කළමනාකරණයේදී බඳවා ගැනීම්, පාරිශ්‍රමික සහ අනෙකුත් සේවා කොන්දේසි පිළිබඳ ඵලදායී රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.
- මහජන අවශ්‍යතා සඳහා ප්‍රතිචාර දැක්වීමේදී දැනට රාජ්‍ය සේවයේ සිටින සේවකයින්ගේ සිතුම් පැතුම් අළුත් මගක් කරා මෙහෙයවීම.
- රාජ්‍ය සේවයේ ඵලදායිතාව සහ ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා නව කළමනාකරණ ව්‍යුහපද්ධතියක් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- හර පද්ධතියක් ස්ථාපිතකොට බෙදාහදා ගැනීම (ප්‍රතිඵල දිශානත ආකල්ප, වගවීම, සම්පත් ප්‍රඥාවන්ත ලෙස යොදාගැනීම, අපක්ෂපාතිත්වය, පාරදෘශ්‍යබව, ආදී)
- පුහුණු වැඩසටහන්වලට පහසුකම් සැපයීම සහ ඒවා පැවත්වීම පිණිස රාජ්‍ය අංශයේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම.
- විශ්‍රාම වැටුප්වලට අදාළ ගැටළුවලට පිළියම් යෙදීම සඳහා විශ්‍රාම වැටුප් වැඩසටහන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- රජයේ සංවර්ධන ඉලක්ක සහ ප්‍රමුඛතා සපුරාලීමේ හැකියාව සහිත රාජ්‍ය අංශයේ ආයතනික සංවර්ධනය සඳහා රාමුවක් සකස් කරගැනීම.
- සේවා සැපයුමේ ඵලදායිතාව සහ ගුණාත්මකබව ඉහළ නැංවීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය යොදාගැනීම ප්‍රවර්ධනය කිරීම.

- රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩලයේ නිපුණතාව වැඩි දියුණු කිරීම.
- වෙනස්වෙමින් පවතින තත්ත්වයන්ට අනුව කටයුතු කිරීම පිණිස පද්ධති සරල කිරීම සහ ක්‍රියාදාම යළි සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ වැඩි දියුණු කිරීම, වර්ධනය කිරීම සහ ක්‍රියාවට නැංවීම.

<u>උපාය මාර්ග</u>

- රාජ්‍ය සේවයේ කාර්යක්ෂම මනාව සම්පත් කළමනාකරණය සඳහා විචක්ෂණ ප්‍රතිපත්තියක් සහ නියාමන රාමුවක්
- රාජ්‍ය සේවා සැපයුමේදී ඵලදායිතාව ඉහළ නැංවීම පිණිස ක්‍රියාදාම යළි සකස් කිරීම සහ පද්ධති සංවර්ධනය සඳහා වන පරිපාලන ප්‍රතිසංස්කරණය
- රාජ්‍ය සේවය සඳහා තරඟකාරී බඳවාගැනීමේ හා තෝරාගැනීමේ ක්‍රියාදාමයන්
- ඉල්ලුම් දිශානත ධාරිතා සංවර්ධනය සහ නිපුණතා ගැලපුම
- සේවා සැපයුම පුරවැසියන්ට සමීප කිරීම සඳහා විමධ්‍යගත කරනු ලැබූ ආයතනික ජාල
- රාජ්‍ය සේවයේ ගුණාත්මකබව ඉහළ නැංවීම සහ සේවා සැපයුමේ පාරදෘශ්‍යභාවය සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම
- පුරවැසියා කේන්ද්‍ර කරගත් රාජ්‍ය සේවයක් වෙත නැඹුරු වූ සේවා සැපයුමක් ප්‍රමිතිගත කිරීම සඳහා පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක්



ප්‍රධාන කාර්යයන්


1. ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සකස් කිරීම; රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ විෂයයන් හා II වන තීරුවේ ලැයිස්තුගත කර ඇති දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා විෂයයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීම.


2. සියළුම දීප ව්‍යාප්ත සේවාවන් පරිපාලනය හා මානව සම්පත් කළමනාරණය,
   - ශ්‍රී ලංකා පරිපාලන සේවය
   - ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය
   - ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය
   - ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය
   - ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවය
   - ශ්‍රී ලංකා තාක්ෂණ සේවය
   - ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය

3. ඒකාබද්ධ සේවාවන් පරිපාලනය කිරීම
4. ආයතන සංග්‍රහය යටතේ වන කාර්යයන්
5. රාජ්‍ය සේවා පුහුණුව
6. ජාතික ඵලදායිතාවය ඉහල නැංවීම සඳහා වූ ප්‍රතිපත්ති හා වැඩසටහන් නිර්මාණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම
7. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම
8. සියළුම රජයේ විශ්‍රාම යෝජනා ක්‍රම සම්බන්ධ කටයුතු
9. අපේක්ෂිත සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා රාජ්‍ය සේවයේ යහපාලනය ප්‍රචලිත කිරීම
10. නව යහපාලන සංකල්ප හඳුන්වාදීම
11. ජනතාවගේ අභිලාෂයන්ට අනුව සාඩම්බර වන රාජ්‍ය සේවාවක් නිර්මාණය කිරීම අරමුණු කරගත් ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම
12. ස්වාභාවික හා මිනිසා විසින් ඇති කරන ලද ආපදා අවම කිරීම, ප්‍රතිචාර දැක්වීම, ප්‍රකෘතිමත් වීම සහ සහන සම්බන්ධ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය හා කළමනාකරණය.
13. ජාතික ප්‍රතිපත්ති මත පදනම්ව ජාතික ආපදා කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම හා ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම සකස් කිරීම
14. ආපදා අවම කිරීම, ප්‍රතිචාර දැක්වීම සහ ප්‍රකෘතිමත් වීම සඳහා විදේශ ආධාරක ව්‍යාපෘති ආරම්භ කිරීම හා සම්බන්ධීකරණය කිරීම

15. ඉහත ක්‍රියාකාරකම් නිසි කලට ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා අමාත්‍යාංශ, රජයේ ආයතන සහ ආයතන, පෞද්ගලික ආයතන සහ දේශීය හා විදේශීය රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධතා පැවැත්වීම.
16. ස්වාභාවික විපත් වල බලපෑමට ඔරොත්තු දිය හැකි ඉදිකිරීම් ප්‍රවර්ධනය කිරීම සහ තාක්ෂණික මග පෙන්වීම
17. නායයෑම් ආපදා කළමනාකරණය සහ අදාළ පර්යේෂණ හා සංවර්ධනය සිදු කිරීම
18. නිවාස හා ඉදිකිරීම් අංශ සඳහා සුදුසු තාක්ෂණයකට පර්යේෂණ හා සංවර්ධනය දිරිමත් කරන්න
19. කාලගුණ විද්‍යා සමීක්ෂණ සහ පර්යේෂණ
20. ස්වාභාවික විපත් පිළිබඳ පුරෝකථනය කිරීම සහ ඒවා සම්බන්ධ අදාළ අංශ සංවේදී කිරීම
21. ස්වාභාවික විපත් සහ මිනිසා විසින් ඇති කරන ලද ආපදා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම
22. ස්වාභාවික හා මිනිසා විසින් ඇති කරන ලද ආපදා වලදී ගලවා ගැනීමේ මෙහෙයුම් සඳහා පියවර ක්‍රියාත්මක කිරීම
23. ජාත්‍යන්තර මානුෂීය සහන සේවා වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම
24. II තීරුවේ ලැයිස්තුගත කර ඇති ආයතනවලට පවරා ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කරුණු
25. II තීරුවේ ලැයිස්තුගත කර ඇති ආයතන අධීක්ෂණය

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
සංවිධාන සැලැස්ම




ආපදා කළමනාකරණ අංශය
ලේකම්
අතිරේක ලේකම් පාලන හා මුදල්
අතිරේක ලේකම් (සංවර්ධන හා ආපදා සහනසේවා)
ප්‍රධාන මූල්‍ය නිලධාරි
අධ්‍යක්ෂ (කළමනාකරණ)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන)
අධ්‍යක්ෂ සැලසුම්
අධ්‍යක්ෂ (ආපදා සහන)
ප්‍රධාන ගණකාධිකාරි
අභ්‍යන්තර විගණක
සහකාර අධ්‍යක්ෂ (කළමනාකරණ)
නීති නිලධාරි
සහකාර ලේකම්
සහකාර ලේකම්
සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)
අතිරේක අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (ආපදා සහන)
ගණකාධිකාරි
භාෂා පරිවර්ථක
පරිපාලන නිලධාරි
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි
සහායක කාර්ය මණ්ඩලය
සහායක කාර්ය මණ්ඩලය
සහායක කාර්ය මණ්ඩලය
සහායක කාර්ය මණ්ඩලය
සහායක කාර්ය මණ්ඩලය
සහායක කාර්ය මණ්ඩලය


2019 වසරේ වැදගත් සිදුවීම්

2019 වසරේ වැදගත් සිදුවීම්


2019 වර්ෂය ආරම්භයේදී, රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය නමින් අදාළ සියලු කටයුතු සිදු කෙරුණු අතර, **2019** නොවැම්බර් 27 වන දින රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යන නමින් ක්‍රියාත්මක විය.
වසර අවසානයේදී ආපදා කළමනාකරණය අංශය හා සම්බන්ධ කාර්යයන් වෙන් කෙරුණු අතර, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන විෂයයන්ට අයත් වෙනත් කාර්යයන් අමාත්‍යාංශය යටතට පැවරුණු අතර අනතුරුව, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යන නමින් ක්‍රියාත්මක වන්නට විය.

- **බඳවාගැනීම්**

දීප ව්‍යාප්ත සේවාවන්හි පැවති පුරප්පාඩු පිරවීම සඳහා 2019 වසරේදී නිලධාරීන් 665 දෙනෙක් රාජ්‍ය සේවයට බඳවාගන්නා ලදී.



ඒකාබද්ධ සේවාවන්හි පැවති පුරප්පාඩු පිරවීම සඳහා 2019 වසරේදී නිලධාරීන් 4,169 දෙනෙක් රාජ්‍ය සේවයට බඳවාගන්නා ලදී.



- **2019 දෙසැම්බර් 31 වන දිනට දීප ව්‍යාප්ත සේවයේ නිලධාරීන්.**

ශ්‍රී ලංකා පරිපාලන සේවය

ශ්‍රේණිය	අනුමත තනතුරු	තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්තය
විශේෂ	374	401	-	27
I	967	690	277	-
II	136	14	122	-
III/II, III	1750	1438	312	-
එකතුව	3227	2543	711	27

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය

ශ්‍රේණිය	අනුමත තනතුරු	තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්තය
විශේෂ	77	3	74	-
I	465	584	-	119
II/III	1442	1055	387	-
එකතුව	1984	1642	461	119

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය

ශ්‍රේණිය	අනුමත තනතුරු	තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්තය
විශේෂ	37	21	16	
I	253	316	-	63
II/III	1171	897	269	274
එකතුව	1461	1234	285	337

ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය

ශ්‍රේණිය	අනුමත තනතුරු	තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්තය
විශේෂ	58	60	-	02
I	177	130	47	-
II/III	824	673	151	-
එකතුව	1059	863	198	02

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය

ශ්‍රේණිය	අනුමත තනතුරු	තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්තය
විශේෂ	01	-	01	-
I	06	03	03	-
II/III	68	42	26	-
එකතුව	75	45	30	-

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය

ශ්‍රේණිය	අනුමත තනතුරු	තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්තය
විශේෂ	**15**	**-**	**15**	**-**
I	**42**	**07**	**35**	**-**
II	**19**	**-**	**19**	**-**
II/III	**507**	**412**	**95**	**-**
III	**08**	**02**	**06**	**-**
එකතුව	**591**	**421**	**170**	**-**

- **2019 දෙසැම්බර් 31 වන දිනට ඒකාබද්ධ සේවයේ නිලධාරීන්.**

සේවය	අනුමත	පවතින	පුරප්පාඩු
රාජ්‍ය කළමනාකරණ සේවය	**30604**	**27629**	**2975**
පරිවර්තක සේවය	**636**	**253**	**380**
පුස්තකාලයාධිපති සේවය	**257**	**134**	**123**
කාර්යාල සේවක සේවය	**-**	**15734**	**-**
රියදුරු සේවය	**-**	**6025**	**-**
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය	**3178**	**1680**	**1498**
සංවර්ධන නිලධාරී සේවය	**45000**	**43026**	**6038**
එකතුව	**79675**	**94481**	**6038**

- **2019 වසරේදී නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

	චක්‍රලේඛ අංකය	නිකුත් කළ දිනය	කාරණය	යොමුව
01	01/2019	2019.01.22	ආයතන සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කරමින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ - 2018	-
02	02/2019	2019.02.22	සම්පූර්ණ වැටුප් සහිතව ලබා ගත් නිවාඩුවක අනිවාර්ය සේවා කාලයක් තුළ සේවය කරමින් සිටින නිලධරයකුට වැටුප් රහිත අධ්‍යයන නිවාඩු ලබා දීම	ආයතන සංග්‍රහයේ XV වැනි පරිච්ඡේදයේ 5 වගන්තිය
03	03/2019	2019.02.20	ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 19:5 උප වගන්තිය යටතේ වූ විනය පරීක්ෂණ නිලධර නාම ලේඛනය	ආයතන සංග්‍රහයේ XLVII වැනි පරිච්ඡේදයේ 19:5 උප වගන්තිය
04	04/2019	2019.02.22	ත්‍රිපිටකය ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම (ශ්‍රී ත්‍රිපිටකාභාවන්දන සතිය 2019.03.16 සිට 2019.03.23 දක්වා)	-
05	05/2019	2019.03.05	දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීම සම්බන්ධයෙන් වන ආයතන සංග්‍රහයේ XXXII වැනි පරිච්ඡේදයේ 2:3:2 උප වගන්තිය සංශෝධනය කිරීම	ආයතන සංග්‍රහයේ XXXII වැනි පරිච්ඡේදයේ 2:3:2 උප වගන්තිය
06	06/2019	2019.02.27	2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන අනුව ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ වගන්ති සංශෝධනය කිරීම	ආයතන සංග්‍රහයේ VI වැනි පරිච්ඡේදයේ 2:9:6 උප වගන්තිය, XXVIII වැනි පරිච්ඡේදයේ 4 වගන්තිය, 9:2 උප වගන්තිය සහ XXXI වැනි පරිච්ඡේදයේ 3:2 උප වගන්තිය
07	07/2019	2019.07.08	අතරමැදි ශ්‍රේණියක උපරිම වැටුප් පියවරට එළඹෙන නිලධරයන්ට එම උපරිම වැටුප් පියවරෙන් ඔබ්බට වැටුප් වර්ධක ගෙවීම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006(III) හා 2008.06.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006(V)
08	08/2019	2019.03.28	ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 36 වගන්තිය සංශෝධනය කිරීම	ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 36 වගන්තිය
09	09/2019	2019.04.22	2019 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ දීමනා සංශෝධනය කිරීම	-
10	10/2019	2019.05.03	2019 රාමලාන් (රාමසාන්) සමයේ දී විශේෂ නිවාඩු ලබා දීම	-
11	11/2019	2019.05.06	රාජ්‍ය ආයතන පරිශ්‍ර තුළ බුලත් විට, දුම්කොළ සහ පුවක් ආශ්‍රිත නිෂ්පාදන භාවිතය සහ විකිණීම තහනම් කිරීම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 08/99

12	12/2019	2019.05.21	භාෂා පරිවර්තක සේවා ව්‍යවස්ථාව අනුව භාෂා පරිවර්තක සේවයේ විශේෂ පන්තියට ජ්‍යේෂ්ඨතාව මත උසස් කිරීම	-
13	13/2019	2019.05.29	රජයට අයත් කාර්යාල පරිශ්‍රවල ආරක්ෂාව තහවුරු කිරීම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/89
14	14/2019	2019.05.31	2019 අයවැය යෝජනා අනුව විශ්‍රාම වැටුප සංශෝධනය කිරීම	-
15	15/2019	2019.06.07	රජයේ ගොඩනැඟිලි හා නිවාස කුලී "20.02.01.01" සඳහා ආදායම් ඇස්තමේන්තු	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ 01/2015
16	16/2019	2019.06.07	රජයේ ගොඩනැඟිලි හා නිවාස කුලී "20.02.01.01" සඳහා හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම - 2019.06.30	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ 01/2015
17	17/2019	2019.07.08	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය	-
18	18/2019	2019.07.08	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය (I, II හා III ශ්‍රේණි)	-
19	19/2019	2019.07.09	වැටුප් වර්ධක දිනයේ දීම උසස්වීම ලැබීමේ දී සහ නිලධරයාගේ මනාපය මත පූර්ව තනතුරට පැමිණීමේ දී අදාළ කර ගත යුතු වැටුප් පියවර තීරණය කිරීම	ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ VII වැනි පරිච්ඡේදයේ 5 වගන්තිය සහ 6:3 උප වගන්තිය
20	20/2019	2019.07.08	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථානමාරු පටිපාටිය - 2020	-
21	21/2019	2019.07.19	ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය - 2020	-
22	22/2019	2019.08.20	කල්තබන ලද මැතිවරණ/ ඡන්ද විමසීම් සඳහා ඉදිරිපත් වූ දේශපාලන අයිතිවාසිකම් හිමි රජයේ නිලධරයන්ට සහන සැලසීම	ආයතන සංග්‍රහයේ XXXII වැනි පරිච්ඡේදයේ 2:3:2 උප වගන්තිය
23	23/2019	2019.08.26	පිළිකා රෝගය වැළඳීම වෙනුවෙන් ආයතන සංග්‍රහයේ XXIII වැනි පරිච්ඡේදය අනුව ලබා දෙන සම්පූර්ණ වැටුප් සහිත විශේෂ නිවාඩු කාලසීමාව දීර්ඝ කිරීම	ආයතන සංග්‍රහයේ XXIII වැනි පරිච්ඡේදයේ 1:3 උප වගන්තිය
24	24/2019	2019.08.20	රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිශ්‍රේණියේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් - 2020	රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 1)හි XVIII පරිච්ඡේදය
25	25/2019	2019.12.30	රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 202 වසර	රාජ පරිපාලන චක්‍රලේඛ 26/2015
26	26/2019	2019.08.29	විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සේවය කිරීම සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් ද්විතීයන පදනම මත මුදා හැරීම	-
27	27/2019	2019.09.09	ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 27:10 උප වගන්තිය සංශෝධනය කිරීම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2004 මඟින් සංශෝධිත ආයතන සංග්‍රහයේ II

				වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 27:10 වන උප වගන්තිය
28	28/2019	2019.09.12	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ I/ II ශ්‍රේණි තනතුරු සඳහා පත්කිරීම වෙනුවෙන් නිලධාරීන් තෝරා ගැනීම, සම්මුඛ පරීක්ෂණ මණ්ඩල පත් කිරීම හා ලකුණු මට්ටම් සැකසීම	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සංශෝධන අංක 01 හා 02
29	29/2019	2019.09.18	තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවාගෙන ඇති සේවකයින් සඳහා ස්ථීර පත්වීම් ප්‍රදානය කිරීම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 හා 25/2014(I)
30	30/2019	2019.09.30	ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13:2, 21:2, 22:1:1 හා 14:12 උප වගන්ති සංශෝධනය කිරීම	ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13:2, 21:2, 22:1:1 හා 14:12 උප වගන්ති
31	31/2019	2019.10.04	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක 2137/5 හා 2019.08.19 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ඇතුළත් කරනු ලැබූ සංශෝධයන් ක්‍රියාත්මක කිරීම	-
32	32/2019	2019.10.31	දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීම සම්බන්ධයෙන් වන ආයතන සංග්‍රහයේ XXXII වැනි පරිච්ඡේදයේ 3:7 උප වගන්තිය සංශෝධනය කිරීම	ආයතන සංග්‍රහයේ XXXII වැනි පරිච්ඡේදයේ 3:7 උප වගන්තිය
33	33/2019	2019.11.08	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක 2137/66 හා 2019.08.22 දිනැතිව අතිවිශේෂ ගැසට් පත්‍ර මඟින් ඇතුළත් කරනු ලැබූ සංශෝධයන් ක්‍රියාත්මක කිරීම	-
34	34/2019	2019.11.21	ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක 2137/26 හා 2019.08.20 දිනැතිව අතිවිශේෂ ගැසට් පත්‍ර මඟින් ඇතුළත් කරනු ලැබූ සංශෝධයන් ක්‍රියාත්මක කිරීම	-
35	35/2019	2019.12.10	රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සංශෝධනය - 2016	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි 05 ඡේදය
36	36/2019	2019.12.07	රජයේ ගොඩනැඟිලි හා නිවාස කුලී "20.02.01.01" සඳහා හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම - 2019.12.31	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ 01/2015
37	37/2019		නිකුත් කර නැත.	
38	38/2019	2019.12.23	2020 වසර - රාජකාරි කටයුතු ඇරඹීම	-
39	39/2019	2019.12.31	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක 2138/27 හා 2019.08.28 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර මඟින් ඇතුළත් කරනු ලැබූ සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම	-

සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

	චක්‍රලේඛ අංකය	නිකුත් කළ දිනය	කාරණය	යොමුව
	21/88(I)	2019.01.29	ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන්, රාජකාරියේ යෙදී සිටියදී තුවාල ලබන/ නිත්‍ය වශයෙන් ආබාධිත වන රජයේ නිලධරයන්ට/ පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන්ට/ රාජ්‍ය සංස්ථා සේවකයන්ට වෛද්‍යාධාර දීමනා/ වන්දි ගෙවීම සහ ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් මරණයට පත්වන එවැනි නිලධරයන්ගේ/ සේවකයන්ගේ යැපෙන්නන්ට වන්දි ගෙවීම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/88
	32/91(IV)	2019.03.13	පළාත් පාලන ආයතනවලට ඡන්දයෙන් තේරී පත්වූ දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය නිලධරයන්	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 32/91(I) හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 32/91(III)
	22/99 (XXXVI)	2019.10.10	රාජ්‍ය නිලධරයන්/ පළාත් රාජ්‍ය නිලධරයන්/ අධිකරණ නිලධරයන් සඳහා ප්‍රවාහන පහසුකම්	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99(XXVII)න් සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99හි 3:2(ආ) අනු ඡේදය
	22/99 (XXXVII)	2019.12.18	රාජ්‍ය නිලධරයන්/ පළාත් රාජ්‍ය නිලධරයන්/ අධිකරණ නිලධරයන් සඳහා ප්‍රවාහන පහසුකම්	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 (XVIII)න් සංශෝධිත 1999.10.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99හි 3:6 අනු ඡේදය
	13/2008(V)	2019.05.31	නිල වාහන සඳහා ඉන්ධන සැපයීම සහ එම වාහන රියදුරන් සඳහා අතිකාල හා සංයුක්ත දීමනා ගෙවීම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2008 හා එහි සංශෝධිත චක්‍රලේඛ
	01/2014(V)	2019.02.05	රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014හි 02 ඡේදය සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014(I) සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014(II)
	01/2014(VI)	2019.08.07	රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014
	01/2014(VII)	2019.10.03	රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට සංශෝධන වශයෙන් නිකුත් කරන ලද රාජ්‍ය

				පරිපාලන චක්‍රලේඛ
	01/2014(VIII)	2019.10.17	රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට සංශෝධන වශයෙන් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ
	18/2015(III)	2019.12.07	රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නිලධරයන්ට විශේෂ දීමනාවක් ලබා දීම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2015. 18/2015(I) හා 18/2015(II)
	03/2019(I)	2019.12.09	ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 19:5 උප වගන්තිය යටතේ වූ විනය පරීක්ෂණ නිලධර නාම ලේඛනය	ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 19:5 උප වගන්තිය
	13/2019(I)	2019.06.26	රජයේ නිලධරයන්ගේ ඇඳුම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8/89 හා 13/2019

- **2018 වසරේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි නිකුත් කිරීම.**

	චක්‍රලේඛ ලිපි අංකය	නිකුත් කළ දිනය	කාරණය	යොමුව
	01/2019	2019.03.19	අසාධු ලේඛනගත කරන ලද නිලධරයන් නැවත සේවයේ පිහිටුවීම	රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XIX පරිච්ඡේදය හා ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ V පරිච්ඡේදයේ 8 වගන්තිය
	02/2019	2019.05.30	විශ්‍රාම වැටුප් ගෙවීමේ දී වංචාසහගත ලෙස මියගිය විශ්‍රාමිකයින් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම වැළැක්වීමේ අවස්ථා පුළුල් කිරීම	-
	03/2019	2019.10.28	විශ්‍රාමික රජයේ නිලධරයන් නැවත සේවයේ යෙදවීම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018
	04/2019	2019.12.27	2020 වසර - රාජකාරි කටයුතු ඇරඹීමට සමගාමීව ජාතික රුක් රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම	පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශ ලේකම්ගේ අංක MMDE/06/FR/06/30 හා 2019.12.26 දිනැති ලිපිය සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 38/2019

මානව සම්පත් සංවර්ධන අංශය

1. එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය අනුව ශ්‍රී ලංකාව තුළද තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ කටයුතු මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. ඒ අනුව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ කාර්යභාරයට අදාළ වන තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක පෙළ ගැස්වීමද ඒ අනුව ක්‍රියාත්මක වීම සඳහා අනුගත වීමද සාර්ථකව ඉටුකරමින් පවතී.

2. මේ වන විට අප අමාත්‍යාංශයේ සේවයේ නියුක්ත ඉහත දැක්වූ නිලධාරී ගණයන්ට අයත් කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පහත දැක්වෙන පරිදි පවත්වන ලදි.

පුහුණුව	ඉලක්ක නිලධාරී ගණන	සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව
රාජ්‍ය සේවයේ ආචාර ධර්ම මිතීන්වටිනාකම් හා ප්‍ර ,	150	145
රියදුරු සේවය සඳහා මූලික කුසලතා	50	20
කළමනාකරණ සේවා නිති	100	89
රාජ්‍ය සේවා කොමිෂන් සභා නීතිරීති	100	84
රාජ්‍ය සේවයේ ආචාරධර්ම ක්‍රියාපිළිවෙත	10	06
ආයතන සංග්‍රහයේ විධිවිධාන	100	100
කාසේවයේ සේවාරම්භක පුහුණුව .ස.කා.	29	29

කළමනාකරණ ප්‍රතිසංස්කරණ හා මහජන සම්බන්ධතා අංශය

1) අංශය සඳහා 2019 වර්ෂය ආරම්භයේදී අනුමත කරන ලද ක්‍රියාකාරී සැලැස්ම මගින්, ඌව වෙල්ලස්ස ප්‍රදේශයද ඇතුලුව සියළු ප්‍රදේශ ආවරණය වන පරිදි භෞතික හා මානව සම්පත් සංවර්ධනය කිරීම අරමුණු කර ගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 25ක් වෙන් කරන ලදී. ඒ අනුව, එම රුපියල් මිලියන 25 මගින් ඌව වෙල්ලස්ස හා ඇනකුත් ප්‍රදේශ වල භාෂා හැකියාව ඉහල නැංවීම ඇතුලත්ව භෞතික හා මානව සම්පත් සංවර්ධනය කිරීම අරමුණු කර ගනිමින්, පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී.

- පෙර පාසල් දරුවින්ගේ කුසලතා වර්ධනය කිරීම සඳහා පුහුණු කට්ටල ලබා දීම
- පාසැල් හැර යන දරුවන්ගේ භාෂා හැකියාවන් වර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම (ජපන් භාෂා පුහුණු වැඩසටහන)
- විවිධ දිස්ත්‍රික්ක වල ඵලදායිතා සංවර්ධන නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- මානව සම්පත් සංවර්ධනය අංශය මගින් දීප ව්‍යාප්ත සේවාවන්හි නියුතු නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- මොණරාගල ප්‍රදේශයේ අභිනවයෙන් ඉදි කරන ලද නිවාඩු නිකේතනය සඳහා පහසුකම් සැලසීම ආදිය ඇතුලත් විය.

2) වර්ෂය මැද භාගයේදී, ඌව වෙල්ලස්සයෙහි පවත්නා ආර්ථික දරිද්‍රතාවය හා ඌන සංවර්ධන තත්වය කෙරේ අවධානය යොමු කරමින්, එහි සමස්ථ ජනතාවගේ ජීවන තත්වය නංවාලීම පිණිස කෘෂි හා නිෂ්පාදන කර්මාන්ත හා ඊට අවශ්‍ය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ඌව වෙල්ලස්ස භෞතික හා මානව සම්පත් සංවර්ධන වැඩපිළිවෙල යටතේ රුපියල් මිලියන 400ක ප්‍රතිපාදන අනුමත විය. ඒ අනුව, ජුනි මස සිට මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කල හැකි වන පරිදි, අංශය මගින් ප්‍රතිපාදන යොමු කිරීමට කටයුතු කරන ලද අතර වර්ෂය අවසාන වන විට ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ වලින් දන්වන ලද සීමාවන්ටද යටත්ව, සියළුම ප්‍රතිපාදන යොමු කර අවසන් කරන ලදී. එම ව්‍යාපෘති වනුයේ,

1) ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ තරුණ ප්‍රජාව සවිබල ගැන්වීමඹ සඳහා ක්‍රීඩා පහසුකම් සැලසීම

2) ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ ජනයාගේ දුගී බව තුරන් කිරීම සඳහා වූ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

3) සමාජ, ආගමික හා සංස්කෘතික වටිනාකම් වැඩි දියුණු කිරීම තුලින් සදාචාර සම්පන්න සමාජයක් බිහි කිරීම.

4) දුෂ්කර පළාත් වල අඩු පහසුකම් සහිත ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා කලාපය තුල රජයේ ආයතන සඳහා යටිතල පහසුකම් සැපයීම හා තෝරා ගත් ප්‍රජා මූලික සංවිධාන සඳහා සුබසාධන පහසුකම් සැපයීම

5) ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ කුඩා හා මධ්‍ය පරිමාණ වැව් අමුණු ප්‍රතිසංස්කරණය කිරීම.

- මීයකෙටුආර වැව ප්‍රතිසංස්කරණය





- කුඩා උහන්පොළ වැව ප්‍රතිසංස්කරණය





- *ඇල්පිටිය හැවන්ආර ඇල ප්‍රතිසංස්කරණය*




- මුතුකෙළියාව, දෙහිගල්ලන්ද වැව ප්‍රතිසංස්කරණය




6. උඟව වෙල්ලස්ස වියළි කලාපය තුල ගම්මාන වල ජල ප්‍රදේශ ආශ්‍රිත යටිතල පහසුකම් සැපයීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.





7. උඟව වෙල්ලස්ස ප්‍රදේශයේ දුෂ්කර ගම්මාන වල අඩු ආදායම්ලාභී පවුල් සඳහා කුඩා පරිමාණ ගෙවතු වගා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

8. උඟව වෙල්ලස්ස ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස පහසුකම් සැපයීම.

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා අංශය

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන්ගේ සියලුම පරිපාලනමය කටයුතු සේවා ව්‍යවස්ථාව, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, ආයතන සංග්‍රහය හා අනෙකුත් වක්‍රලේඛයන්හි විධිවිධාන අනුව ක්‍රමසම්පාදන සේවා අංශය මගින් සිදු කරනු ලැබේ.

- ජ්‍යෙෂ්ඨතා ලේඛණය හා පුරප්පාඩු ලේඛණය වෙබ් අඩවියෙහි පළ කිරීම හා යාවත්කාලීන කිරීම.
- කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අන්තර්ජාලය හරහා අයදුම් කිරීමට පහසුකම් සැපයීම හා පළමුවන කාර්යක්ෂමතා විභාගය හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීම.
- ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ පුරප්පාඩු පිරවීමට නවක නිලධාරීන් 106 දෙනකු බඳවා ගැනීම හා සීමිත පදනම මත බඳවා ගත් නිලධාරීන් 31 දෙනෙකු 2019.10.31 දින සේවාරම්භක පුහුණුව සාර්ථක ලෙස අවසන් කර, 2019.11.04 දින සිට දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කිරීම. විවෘත පදනම මත බඳවා ගත් නිලධාරීන් 106 දෙනා හට 2020 වසරේ මුල් බාගයෙන් අවසන් වන පරිදි සේවාරම්භක පුහුණුව පවත්වාගෙන යාම.








- අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයන්ට අනුකූල වන පරිදි අනෙකුත් දීප ව්‍යාප්ත සේවා මෙන්ම ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ සේවා ව්‍යවස්ථාවට සිදු කරන ලද සංශෝධනය 2019.08.20 දිනැතිව අති විශේෂ ගැසට් පත්‍රයක් මඟින් පල කිරීම.
- 2008, 2009 හා 2013 වර්ෂයන්හි ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයට බඳවා ගන්නා ලද නිලධාරීන් II ශ්‍රේණියට උසස් කිරීමේ කටයුතු.
- ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I, II හා III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වාර්ෂික ස්ථාන මාරු ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම.

තොරතුරු තාක්ෂණ අංශය

කළමනාකරණ නොවන නිලධාරීන්ගේ තොරතුරු තාක්ෂණය සම්බන්ධ දැනුම වැඩි කිරීම සඳහා පුහුණු සැසිය සංවිධානය කරන ලදී. MS word, MS excel සහ සාමාන්‍ය තොරතුරු තාක්ෂණ භාවිතයන් වැනි විවිධ මාතෘකා තුනකින් එය පවත්වන ලදී. එය 2019 සැප්තැම්බර් 17 සිට 2019 අවසානය දක්වා සැලසුම් කර තිබුණි. පුහුණු වැඩසටහන් කාලසටහනට අනුව සැසි 126 ක් පැවැත්වූ අතර එහිදී නිලධාරීන් 164 ක් සහභාගී වූහ. පුහුණු සැසිවාරයට සහභාගී වූ නිලධාරීන්ට මෙම මාතෘකා තුන පිළිබඳ ප්‍රායෝගික දැනුමක් ලබා දී ඇති අතර එමඟින් ඔවුන්ගේ කාර්යසාධන ය සහ අමාත්‍යාංශයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට උපකාරී වේ.





ආයතන අංශය

පුහුණු වැඩසටහන් මාලාවක් - ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳව රාජ්‍ය සේවා නිලධාරීන් දැනුවත් කිරීම.





අභ්‍යන්තර විගණන අංශය

විගණන කළමණාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම



ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාම වැටුප් ගෙවීම් සම්බන්ධයෙන් විගණන පරීක්ෂණ සිදුකිරීම



ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය

- ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියට විවෘත/ සීමිත පදනම මත බඳවාගැනීම 2016 (2018) යටතේ නිලධාරීන් 186 දෙනෙකු සඳහා 2019.02.05 සහ 2019.02.06 යන දෙදින තුල පත්වීම් ලබාදෙන ලදි.
- ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියට කුසලතා පදනම මත බඳවාගැනීම 2016 (2018) යටතේ නිලධාරීන් 24 දෙනෙකු සඳහා 2019.03.18 සහ 2019.06.03 දිනැතිව පත්වීම් ලබාදෙන ලදි.





- ඒ අනුව 2019 වර්ෂයේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ පැවති III ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා ඉහත බඳවාගත් නිලධාරීන් 208ක් 2019.07.01 දින සිට පහත පරිදි අනුයුක්ත කරන ලදි.

-අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ කොමිෂන් සභා	106
-දිස්ත්‍රික් ලේකම්/ ප්‍රා. ලේ.	58
-පළාත් සභා	44
	208

- 2019.03.18 හා 2019.08.27 දිනැතිව ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට බඳවාගත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සේවාරම්භක පුහුණුව ලැබූ නිලධාරීන් 16 දෙනෙකු 2019.12.02 දින සිට පහත පරිදි අනුයුක්ත කරන ලදි.

-අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ කොමිෂන් සභා	08
-දිස්ත්‍රික් ලේකම්/ ප්‍රා. ලේ.	03
-පළාත් සභා	05
	16

- කුසලතා පදනම මත පත්වීම් භාර නොගත් නිලධාරීන්ගේ පත්වීම් අවලංගු කිරීමටත් අවසන් බඳවා ගැනීම් අදියර ලෙස ඊළඟට වැඩිම ලකුණු ලබා ඇති නිලධාරීන් 08 දෙනෙකු සඳහා පත්වීම් ලබා දීමටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ලබා දුන් තීරණ අනුව 2019.12.23 දින සිට බඳවා ගැනීමට කටයුතු කර ඇත.

- 2019.05.02 දින වන විට සුදුසුකම් සම්පූර්ණ කරන ලද III ශ්‍රේණියේ නිලධාරීන් 139 දෙනෙකු ගේ සේවය ස්ථීර කරන ලදි.
- ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සුදුසුකම් සම්පූර්ණ කරන ලද III ශ්‍රේණියේ නිලධාරීන් 222 ක් 2019 වර්ෂයේදී වන විට II ශ්‍රේණියට උසස් කරන ලදි.
- ගණකාධිකාරී සේවයේ නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය හා ඒ සඳහා නිලධාරීන් 273 දෙනෙකු සහභාගී කරවා ඇත. (මේ සඳහා කැඳවීම් කරන ලද නමුත් සහභාගී නොවූ නිලධාරීන් 07 දෙනෙකු ඉදිරියේදී සහභාගී වීමට නියමිතය)
- මෙම වසර තුළදී විශ්‍රාම ගැනීමට නියමිත නිලධාරීන් 60 ක් සඳහා අදාල සියලුම ආයතන කටයුතු නිමකර ඇත.
- වාර්ෂික ස්ථානමාරු යටතේ නිලධාරීන් 78 ක් ද වාර්ෂික නොවන ස්ථානමාරු යටතේ නිලධාරීන් 107 ක් ද මෙම වර්ෂය තුළ ස්ථානමාරු ලබා ඇත.
- මෙම සේවයේ නිලධාරීන් 36 දෙනෙකු සඳහා විනය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට කටයුතු කර ඇති අතර ඉන් 05 දෙනෙකු සඳහා චෝදනාපත්‍ර නිකුත් කරන ලදි. ඊට අමතරව නිලධාරීන් 03 දෙනෙකුගෙන් නිදහසට කරණු විමසා ඇත. වර්ෂය තුල (2019.09.30 දක්වා) නිලධාරීන් 18 දෙනෙකු සඳහා විනය නියෝග නිකුත් කර ඇත.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

✓ විශ්‍රාම වැටුප් හිමි රාජ්‍ය නිලධාරියකු නිලධාරිනියක මිය ගිය පසු ඔහුගේ/ඇයගේ කලත්‍රයාට, අනත් දරුවන්ට හා ආබාධිත අනත් දරුවන්ට මාසික විශ්‍රාම වැටුප් ලබා දීමේ කාර්යයන්හි නියුතු වැන්දඹු අනත්දරු දායක මුදල් අංශයෙහි මූලික කාර්යයන් වන්නේ දායක මුදල් එක් රැස් කර ගැනීම සහ දායක මුදල් ආපසු ගෙවීම වන අතර දායක මුදල් ආපසු ගෙවීමේ ක්‍රමවේදයෙහි කාර්යක්ෂමතාවය වැඩි කිරීම, එකී ක්‍රියාවලිය වේගවත් කිරීමේ අරමුණින් 2019 වසරෙහි දායක මුදල් ආපසු ගෙවීම සඳහා මාර්ග ගත ක්‍රමවේදය හඳුන්වා දෙනු ලැබුණු අතර ඒ අනුව දායක මුදල් ආපසු ගෙවීමේ ක්‍රියාවලිය මේ වන විට වේගවත් කාර්යක්ෂම සේවාවක් බවට පත් වී තිබේ.

✓ රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය කල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව 2017.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ගනු ලැබූ සියළුම රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් සංශෝධන සිදු කිරීමට මාර්ගගත ක්‍රමයක් හඳුන්වා දෙමින් මේ වන විට සමස්ත විශ්‍රාමිකයින්ගෙන් 90% කට වඩා වැඩි ප්‍රතිලාභ හිමි කරදීමට හැකිවී තිබේ.

✓ 2019 අයවැය ප්‍රකාශනය අනුව 2016.12.31 දක්වා විශ්‍රාම ගිය සියලුම රජයේ හා ත්‍රිවිධ හමුදා නිලධාරීන්ගේත් ඔවුන්ගේ වැන්දඹුවන්ගේත් විශ්‍රාම වැටුප 2017 වර්ෂයේ රජයේ වැටුප් ව්‍යුහයන්ට සමාන්තර වන ලෙස පරිවර්තනය 2019 වසරේ ජුලි මාසයේ සිට ක්‍රියාත්මක වූ අතර වැටුප් ගැළපීම සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මධ්‍යගත දත්ත පද්ධතිය වැඩි දියුණු කරමින් නව තොරතුරු තාක්ෂණ මෘදුකාංගයක් හඳුන්වා දෙනු ලැබිණි. විශ්‍රාම වැටුප් සංශෝධන ක්‍රියාවලිය දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඔස්සේ මාර්ගගත ක්‍රමවේදයට මනා විනිවිද භාවයකින් නිවැරදිව සහ වේගවත්ව සිදු කිරීමට එමඟින් අවස්ථාව හිමි විය.

- ✓ විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලියේ දී විශ්‍රාම වැටුප් ලාභියා ජීවතුන් අතර සිටින බවට තහවුරු කර ගැනීම සඳහා සෑම වසරකදීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, විශ්‍රාමික ප්‍රජාවගෙන් ලබා ගන්නා ජීවිත සහතිකය (Life Certificate) නවීන තාක්ෂණික ක්‍රමෝපායන් සමඟ බද්ධ කරමින් ජෛවමිතික (Biometric) ක්‍රමවේදය ට ලබා ගැනීමේ ආරම්භය ද 2019 වසර අවසානයෙහි සනිටුහන් විය. ජීවිත සහතික අයදුම්පත්‍ර ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා විශ්‍රාමිකයන් වෙත ලබා දී එම දත්ත නැවත ලබා ගැනීම සඳහා පෙර පැවති දීර්ඝ කාලයක් ගතවන්නා වූ සංකීර්ණ ක්‍රමවේදය ඒ අනුව වඩා සරල වේගවත් ක්‍රමයක් බවට පත් වන අතරම නව ක්‍රමවේදය විශ්‍රාමිකයාට ද පහසුවෙන් සම්බන්ධ විය හැකි ක්‍රමවේදයක් වේ. එමෙන්ම විශ්‍රාමිකයන්ගේ ඇඟිලි සලකුණු ලබා ගැනීමෙන් ජීවත් වන බවට තහවුරු කර ගැනීම තුළින් පසුගිය කාල සීමාවේ දිගින් දිගට වාර්තා වූ විශ්‍රාම වැටුප් වංචා සිදු කිරීමේ අවස්ථා මෙම ක්‍රියාවලිය ඔස්සේ අවම කර ගැනීමට කිරීමට හැකියාව ලැබේ.

- ➢ **2019 වර්ෂයේ නිකුත් කර ඇති චක්‍රලේඛ හා උපදෙස් ලිපි**

	චක්‍රලේඛ අංකය	කාරණය
1	3/2015 (III)	විශ්‍රාම ගනු ලබන දිනටම විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා දීම.
2	1/2019	2019 අයවැය යෝජනා අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 ට විශ්‍රාම වැටුප් ගැලපීම
3	1/2019 (I)	2019 අයවැය යෝජනා අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 ට විශ්‍රාම වැටුප් ගැලපීම - පොදු උපදෙස්
4	1/2019 (II)	2019 අයවැය යෝජනා අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 ට විශ්‍රාම වැටුප් ගැලපීම - ත්‍රිවිධ හමුදා නිලධාරීන් සඳහා
5	1/2019 (III)	2019 අයවැය යෝජනා අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 ට විශ්‍රාම වැටුප් ගැලපීම - පොදු උපදෙස්
	1/2019 (IV)	2019 අයවැය යෝජනා අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 ට විශ්‍රාම වැටුප් ගැලපීම
	2/2019	2020 වර්ෂයේ විශ්‍රාම වැටුප් ගෙවීම
	3/2019	පොලිස් නිලධාරීන් සඳහා දුබලතා විශ්‍රාම වැටුප් ගෙවීම
	මෙතෙක් අනුමැතිය ලබා දී නැත.	විශ්‍රාම වැටුප් ලබන නිලධාරියෙකුට විශ්‍රාම වැටුප් ලබා ගැනීමට අපහසු අවස්ථාවක භාරකරුවෙකු පත් කිරීම පිළිබඳ ගිවිසුම
		තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවා ගෙන ඇති සේවකයින් සඳහා ස්ථිර පත්වීම් ප්‍රදානය
		ක්‍රියාන්විත රාජකාරියේදී ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මිය ගිය ශ්‍රී ලංකා පොලිස් විරුවන්ගේ වැන්දඹු බිරින්දෑවරුන් හා ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් තුවාල ලබා ආබාධිතව වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වා ඇති පොලිස් විරුවන් වෙත රණවිරු සුරුකුම් දීමනාව ගෙවීම

	උපදෙස් ලිපි	කාරණය
	1/2019	විශ්‍රාම වැටුප සක්‍රීය කිරීම
	2/2019	රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විශ්‍රාම ගැන්වීමේදී විධිමත් විශ්‍රාම ගැන්වීමේ ලිපියක් නිකුත් කිරීම
	3/2019	විශ්‍රාම වැටුප් සංශෝධනය කරනු ලබන අවස්ථාවේ දී පාරිතෝෂික ගෙවීම
	4/2019	2018.01.01 ට පෙර සේවය අවසන් වී ඇති අමාත්‍යාංශ ලේකම්වරුන් සඳහා රු.25,000 ක විශේෂ දීමනාවක් විශ්‍රාම වැටුපට එකතු කිරීම.
	4/2019 (I)	2018.01.01 ට පෙර සේවය අවසන් වී ඇති අමාත්‍යාංශ ලේකම්වරුන් හා සමාන්තර වැටුප් තලයන්හි සේවය කල නිලධාරීන් වෙනුවෙන් රු.25,000 ක විශේෂ දීමනාවක් විශ්‍රාම වැටුපට එකතු කිරීම.
	4/2019 (II)	2018.01.01 ට පෙර සේවය අවසන් වී ඇති අමාත්‍යාංශ ලේකම්වරුන් සඳහා රු.25,000 ක විශේෂ දීමනාවක් විශ්‍රාම වැටුපට එකතු කිරීම.
	5/2019	වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් නිසි පරිදි අය නොකිරීම.
	6/2019	හමුදා සේවා සහ දුබලතා විශ්‍රාම වැටුප ඒකාබද්ධ කර ගෙවීම මැයෙන් 2018.07.17 දිනැතිව නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 9/2008 (සංශෝධන II) සඳහා මග පෙන්වීම.
	7/2019	විශ්‍රාම වැටුප් ගොනු පරිලෝකනය කිරීමේ පද්ධතිය සඳහා පිවිසීමට පහසුකම් සැලසීම.
	9/2019	PD 3 මාර්ගගත අයදුම්පත්‍රය සංශෝධනය කිරීම.
	10/2019	උපතේදී ආබාධිත නොවන විට ආබාධිත විශ්‍රාම වැටුප් හිමි ගැන්වීම සඳහා වසර 5කට වරක් වෛද්‍ය මණ්ඩලයට යොමු කල යුතු වීම.
	11/2019	දුබලතා විශ්‍රාම වැටුප් ලබා ගන්නා විශ්‍රාමික නිලධාරීන්, වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කල යුතු දිනට යොමු නොකිරීම හේතුවෙන් අත්හිටවා ඇති දුබලතා විශ්‍රාම වැටුප් නැවත සක්‍රීය කිරීම.
	12/2019	2020 වර්ෂය සඳහා විදේශගත ශ්‍රී ලාංකික විශ්‍රාමිකයින්ගේ වාර්ෂික ජීවිත සහතික ලබාදීම

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය

1. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු සඳහා ධාරිතා වර්ධන වැඩසටහන්





2. මාර්ගගත විභාග





3. ප්‍රසිද්ධ සම්මන්ත්‍රණ පැවැත්වීම



4. KDI පාසල සමඟ සහයෝගයෙන් සිදුකරන ලද මිශ්‍ර ඉගෙනුම් වැඩසටහන

කාර්ය සාධන කළමනාකරණය පිළිබඳ මිශ්‍ර ඉගෙනුම් වැඩසටහන

ඩීඑල්සී විසින් කොරියාවේ කේඩීඅයි පාසල හරහා කාර්ය සාධන කළමනාකරණය පිළිබඳ මිශ්‍ර ඉගෙනුම් වැඩසටහනක් සාර්ථකව ඉදිරිපත් කළේය. මෙම වැඩසටහන වීඩියෝ සම්මන්ත්‍රණ 7 කින් සහ කොරියාවේ මුහුණට මුහුණලා පුහුණුවකින් සමන්විත විය.







5. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සේවයේ (SLITS) නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන






6. පද්ධති හා ජාල පරිපාලනය පිළිබඳ වැඩසටහන

7. ප්‍රසම්පාදනය පිළිබඳ සහතික පාඨමාලාව - ස්වදේශ කටයුතු අමාත්‍යාංශය




8. රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ විනය ක්‍රියා පටිපාටිය පිළිබඳ සහතික පාඨමාලාව - ස්වදේශ කටයුතු අමාත්‍යාංශය



9. තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සහතික පාඨමාලාව - ස්වදේශ කටයුතු අමාත්‍යාංශය





10 සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුයුක්ත කාර්ය මණ්ඩලය සඳහා කුසලතා පුහුණුව.





11. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ නිලධාරීන් සඳහා විශේෂ පුහුණුවක්





ආපදා කළමනාකරණ අංශය

හැඳින්වීම

ආපදා කළමනාකරණ විෂය වඩාත් වැදගත් වීමට හේතුවූ ප්‍රධාන සාධකය වූයේ ශ්‍රී ලාංකීය ජනතාවට මින් පෙර අත්දකින්නට නොලැබුණු ආකාරයේ සිදුවීමක් වූ වර්ෂ 2004 දෙසැම්බර් මස 26 වන දින බලපෑ සුනාමි ව්‍යසනයෙන් තිස්පන්දහසකට (35000) අධික ජීවිත සංඛ්‍යාවක් අහිමි වීමය. එම ව්‍යසනයෙන් ලක්ෂ 5කට අධික ජනතාව අභ්‍යන්තර අවතැන් වූවන් බවට පත්විය.

සිදු වූ ජීවිත හානි, ආර්ථික පසුබෑම සහ ඉන් සමාජයට වූ බලපෑම සම්බන්ධයෙන් සුහසාධන කටයුත්තක් සේ පැවති ආපදා කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් හා නීතිමය ව්‍යුහයක අවශ්‍යතාවය ඉස්මතු විය. ඒ අනුව මෙවැනි ව්‍යසනයන්ට සාර්ථකව මුහුණදීමට අවශ්‍ය ආයතනික හා නීතිමය ව්‍යුහය නිර්ණය කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් ස්ථාපිත කරන ලදී. එම තේරීම් කාරක සභාවේ නිර්දේශයන්ට අනුව 2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගන්නා ලදී.

ඒ අනුව 2005 අංක 13 දරණ ව්‍යසන කළමනාකරණ පනතින් ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවත්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයත් ස්ථාපිත කරන ලදී. එම ආයතන තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා වර්ෂ 2006 ක් වූ පෙබරවාරි මස 20 වෙනි දින නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ආපදා කළමනාකරණ හා මානව හිමිකම් පිළිබඳ කැබිනට් අමාත්‍යාංශය ස්ථාපිත කරන ලද අතර, 2010 අප්‍රේල් මස 30 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ලෙස නම් කොට ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය අමාත්‍යාංශය යටතට ගෙනෙන ලදි. නැවත එය 2018.05.01 දිනැති අංක 2069/17 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වශයෙන් නම් කරන ලදී. ඉන් අනතුරුව 2018.12.28 දිනැති අංක 2103/33 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වශයෙන් නැවත නම් කරන ලදි.

ආපදා කළමනාකරණයේ දී අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය , කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යන ආයතන මඟින් අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යයන් සහ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා ආපදාවක් වීමට පෙර ආපදා අවස්ථාවේ දී සහ ආපදාවලින් පසුව ද මහත් සේවයක් ඉටුකරනු ලැබේ. මේ නිසා ආපදාවලින් ජන ජීවිත , දේපල සහ සේවා සුරක්ෂිත වීමත්, ප්‍රත්‍යාස්ථ සමාජයක් උදෙසා ප්‍රජා සුරක්ෂිතභාවය තහවුරු කිරීමත්, පශ්චාත් ආපදා අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහාත් පහසුකම් සැපයීම සිදුකරනු ලබයි.

අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය සහ මාර්ගෝපදේශකත්වය යටතේ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් පහත සඳහන් කාර්යයන් පසුගිය වසර පුරා ක්‍රියාත්මක කරන ලදී.

- ✓ **විපතට පත් ජනතාව සඳහා අවශ්‍ය සහන සැලසීම**

- ✓ **ආපදා වලින් පීඩාවට පත්වන ජනතාව වෙනුවෙන් ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම (ආපදා ප්‍රත්‍යස්ථ නිවාස ඉදි කිරීම ආදිය)**

- ✓ **ස්වාභාවික මෙන්ම මිනිසා විසින් නිර්මිත ආපදාවලින් පීඩාවට පත් ජනතාවගේ ජීවනෝපායන් සහ ආර්ථිකය යථා තත්ත්වයට පත් කරනු පිණිස පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

- ✓ **නියඟයෙන් වන පීඩා අවම කිරීම සඳහා ජල සැපයුම් හා නියං සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

- ✓ **ආපදා තත්ත්වයන් පිළිබඳ දත්ත රැස් කිරීම සහ තොරතුරු ප්‍රචාරය කිරීම.**

- ✓ **ආපදා වාතාවරණයන්ට මුහුණ දෙන ආකාරය සහ සහන යාන්ත්‍රණ පිළිබඳව රාජ්‍ය නිලධාරීන් සහ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙයවීම.**

- ✓ **හදිසි ආපදා තත්ත්වයකදී සහන මෙහෙයුම සම්බන්ධීකරණය කිරීම.**

- ✓ **කාර්ය-සම්පාදන සේවාවන් සැපයීම.**

දැක්ම

"සුරක්ෂිත ශ්‍රී ලංකාවක්"

මෙහෙවර

ශ්‍රී ලංකාව තුළ ස්වාභාවික සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන්නා වූ ආපදා වලින් ඇතිවන අහිතකර බලපෑම් ඵලදායි ලෙස වැළැක්වීම සහ අවම කිරීම තුළින් සමෘද්ධිමත් සහ අභිමානවත් ජන ජීවිතයක් සඳහා පහසුකම් සැපයීම.

අරමුණු

- **ජාතික ආපදා කළමනාකරණ ප්‍රතිපත්ති සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.**
- **පූර්ව අනතුරු ඇඟවීමේ සහ ප්‍රචාරණය කිරීමේ යාන්ත්‍රනය ක්‍රියාත්මක කිරීම.**
- **සියළු ස්ථර සඳහා ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.**
- **සංවර්ධන සැලසුම් සඳහා ආපදා අවදානම අවම කිරීමේ ක්‍රියාදාමයන් අනුගත කිරීම.**
- **සංවර්ධන සැලසුම් ක්‍රියාවලිය සඳහා බලපෑම් තක්සේරුකරණය අනුගත කිරීම.**
- **ආපදා අවදානම අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් එම ප්‍රදේශ ආපදාවන්ට ලක්වීම අවම කිරීම.**
- **නායයෑම් අවදානම් තක්සේරුකරණය සහ සහතික නිකුත් කිරීම**
- **ආපදා වලින් විපතට පත් වූවන් සඳහා සහන සැපයීම**
- **ආපදා මූලික පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන්**
- **පශ්චාත් ආපදා පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණය**

කාර්යයන්

මෙම අභිමතාර්ථ ඉටු කර ගැනීම සඳහා 2015 සැප්තැම්බර් 21 නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් අමාත්‍යාංශය වෙත පහත සඳහන් කාර්යයන් පවරා ඇත.

- ආපදා කළමනාකරණ විෂයයට සහ ඊට අදාල දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති,වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම සහ ඇගයීම.

- ස්වාභාවික විපත් හා මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන විපත් ලිහිල් කිරීම , ප්‍රතිචාර දැක්වීම, ප්‍රතිසාධනය හා සහන සැලසීමේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය හා කළමනාකරණය.
- ජාතික ප්‍රතිපත්ති මත පදනම් වූ ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්ම හා ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම සැකසීම.
- ව්‍යසන ලිහිල් කරලීම, ප්‍රතිචාර දැක්වීම සහ ප්‍රතිසාධනය පිළිබඳ විදේශීය ආධාර ව්‍යාපෘති ආරම්භ කිරීම හා සම්බන්ධීකරණය.
- ඉහත කාර්යභාරයන් නිසි වේලාවට ක්‍රියාත්මකවීම සහතික කරගැනීම පිණිස අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන , දේශීය හා විදේශීය රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධීකරණය.
- පාරිසරික අවදානම් වලට ඔරොත්තු දිය හැකි තාක්ෂණික ප්‍රමිතියකින් යුත් නිවාස තැනීම ප්‍රවර්ධනය කිරීම.
- නිවාස හා ඉදිකිරීම් යන අංශ සඳහා යෝග්‍ය තාක්ෂණයට අදාල පර්යේෂණ හා සංවර්ධන කටයුතු දිරිගැන්වීම.
- කාලගුණ විද්‍යාත්මක සමීක්ෂණ හා පර්යේෂණ සිදුකිරීම.
- ස්වාභාවික ව්‍යසන පෙරයිම් කිරීම හා ඒ පිළිබඳ අදාළ අංශ දැනුවත් කිරීම.
- ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදුකරනු ලබන ව්‍යසන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.
- ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදුකරනු ලබන ව්‍යසනවල දී ගලවාගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම.
- ජාත්‍යන්තර මානුෂීය සහනසේවා වැඩසටහන් සම්බන්ධීකරණය.
- ආපදා කළමනාකරණ විෂයට අදාල දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්ට පැවරී ඇති සියළුම විෂයන්ට අදාළ කටයුතු අධීක්ෂණය කිරීම

1.1 ස්ථාන මාරුවීම් / විශ්‍රාම ගැන්වීම්

2019 වර්ෂයේ ජනවාරි මස සිට එම වර්ෂයේ දෙසැම්බර් මස දක්වා අමාත්‍යාංශයේ සේවක මහත්ම මහත්මීන් හත්දෙනෙකු (07) වෙනත් සේවා ස්ථාන සඳහා මාරුවීම් ලැබ ඇති අතර, අමාත්‍යාංශය වෙත ස්ථානමාරු ලැබ පැමිණි සේවක මහත්ම මහත්මීන් ගණන තුනකි (03) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නව පත්වීම් එකක් (01) සහ උපාධිධාරී පුහුණු නිලධාරීන් තුනක් (03) අමාත්‍යාංශයේ සේවය සඳහා එක්වී ඇත.

1.2. ආපදා කළමනාකරණ හා ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධාන පනත් සකස් කිරීම

අමාත්‍යාංශය විසින් සකස් කරන ලද 2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ආපදා කළමනාකරන සංශෝධිත පනත් කෙටුම්පත නීති කෙටුම්පත්කරු වෙත යොමු කර ඇත. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධාන පනත නීති කෙටුම්පත්කරු විසින් සකස් කොට නීතිපති ගේ අනුමැතිය ලබාගත් පසු පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

1.3. මහජන පැමිණිලි

අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ආයතනයන්හි සේවාව අපේක්ෂාවෙන් මහජනතාව විසින් ඔවුන් ගේ ගැටළු සම්බන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කරන අතර, එම පැමිණිළි ඒ ඒ ආයතන වෙත යොමු කරමින් මහජනතාවගේ ගැටළු සඳහා විසඳුම් ලබාදීමේ සම්බන්ධීකරණ කටයුතු අමාත්‍යාංශය මඟින් ඉටුකරන අතර, 2019 වර්ෂය තුළ මහජන පැමිණිලි 380 ක් ලැබී ඇත. එම පැමිණිලි අදාල ආයතන අංශ වෙත යොමු කිරීම සිදු කර ඇත.

1.4. අමාත්‍ය මණ්ඩල සංදේශ සම්බන්ධ කටයුතු

2019 වර්ෂය සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ 20ක් අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇති අතර ඉන් 18ක් සඳහා අමාත්‍ය මණ්ඩල තීරණ ලැබී ඇත. ඉදිරි සංදේශ 02 නැවත අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී

1.5. පුහුණු වැඩසටහන්

1.5.1 දේශීය

2019 වර්ෂය සඳහා රු.800,000.00 ක ප්‍රතිපාදන පුද්ගල ධාරිතා වර්ධනය වෙනුවෙන් වෙන් වී ඇති අතර 2019.12.31.වන විට රු. 598.454 ක් ප්‍රතිපාදන වැය කර ඇත.

අමාත්‍යාංශ නිලධාරින්ගේ හැකියා වර්ධනය කිරීමේ අරමුණින් රජයේ අනුබද්ධ ආයතන වන මිලෝදා ආයතනය ,නිපුණතා සංවර්ධන ආයතනය ,ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය , ආදී ආයතන වල දීර්ඝ කාලීන හා කෙටි කාලීන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරින් 20 ක් යොමු කර ඇත.

තවද 2019 වර්ෂයේදී ආපදා කළමනාකරණ අංශය හා ඒ යටතේ ඇති ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ නිලධාරින් හා එක්ව නිලධාරීන්ගේ ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට හා නිලධාරින්ට ආතති කළමනාකරණය පිළිබඳ පුහුණුවක් ලබා දීමේ වැඩමුළුවක් 2019/10/25,26,27 තෙදින ජාතික මිරිදිය ධීවර සහ ජලජීවී වගා පුහුණු ආයතනය (කලාවැව) දී පවත්වනු ලැබීය.

පෙර වසරේදී මෙන් දෙවන භාෂා දෙමල IV මට්ටම සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවෙන් කැඳවන ලද දේශකවරයෙක් මාර්ගයෙන් පැය 50 පාඨමාලාවක් පවත්වා , සහතික පත්‍ර අමාත්‍යාංශය විසින් නිකුත් කිරීමට අදාල මුලික කටයුතු සිදු වෙමින් පවතින අතර 2020 ජනවාරි මස සිට මෙම දේශන පැවැත්වීමට කටයුතු යොදා ඇත.

1.5.2. විදේශීය

2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා අමාත්‍යාංශයේ නිලධාරීන් 11 දෙනෙකු විදේශ පුහුණු අවස්ථා සඳහා විදේශ ගත වී ඇත.

1.6. ඵලදායිතා / කළමනාකරණ වැඩසටහන

2019/08/30 වන දින ඵලදායිතා සංකල්ප තවදුරටත් ක්‍රමවත්ව පවත්ගෙන යාමට අමාත්‍යාංශයේ නිලධාරීන් ඒකරාශි කර වැඩමුළුවක් පවත්වන ලද අතර මේ වන විට අංශ තුලින් ඵලදායිතා කව පිහිටුවා ඒ සඳහා නායකයන්ද පත් කර ඔවුන් සඳහාද 2019.12.23 දින කව නායක රැස්වීමක් පවත්වා කල යුතු කටයුතු දැනුම් දෙන ලදි. තවද මේ වන විට අපහරණය කල යුතු හා ලේඛනාගාර ගත කල යුතු පැරණි ලිපි ගොනු සම්බන්ධව තීරණ ගැනීමට කමිටුවක්ද පත්කර ඇත.

1.7 උපදේශන කාරක සභා ක්‍රියාත්මක කිරීම පිලිබඳ ප්‍රගතිය

අමාත්‍යාංශ උපදේශක කාරක සභා වාර 02ක් 2019.03.19 දින හා 2019.05.23 දින පවත්වා ඇත.

1.8. පාර්ලිමේන්තු ප්‍රශ්න පිළිබඳ ප්‍රගතිය

2019.01 .01 සිට 2019.12.31 දක්වා කාලය තුල පාර්ලිමේන්තු ප්‍රශ්න 23 ක් ලැබී ඇති අතර ඒ සියල්ල සඳහා පිළිතුරු ලබා දී ඇත.

02. සැළසුම් හා සංවර්ධන කටයුතු

සැලසුම් අංශය

2.1. රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 402 හි 241 ප්‍රකාරව 2018 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. එය 2019.06.28 දින තිරසර සංවර්ධන හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කිරීමට කටයුතු කර ඇති බව පාර්ලිමේන්තු සභා නායක කාර්යාලය මඟින් දැනුම් දී ඇත.

2.2. 2019 වර්ෂයට අදාලව සකස් කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් 03 ක් ගරු ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි. කාර්තුමය වශයෙන් ප්‍රගති සමාලෝචන සාකච්ඡා 02 ක් පවත්වා ඇත. මෙහිදී අනුබද්ධ ආයතනයන්හී හා අනෙකුත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමත් පසු විපරම් සිදු කිරීම තුළින් අපේක්ෂිත අරමුණු කරා ලඟාවීමටත් හැකියාව ඇතිවිය.

2.3. 2020 අයවැය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේ දී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් නව ව්‍යාපෘති 14 ක් ද ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය මඟින් ව්‍යාපෘති 07 ක් ද ඉදිරිපත් කර ඇත. ආපදා අවධානම් අවම කරණය සඳහා වූ සෙන්දායි රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා සංකල්ප පත්‍රයක් ද ඉදිරිපත් කරන ලදි.

2.4 අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය සකස් කර කාර්තුමය වශයෙන් ජනාධිපති කාර්යාලය වෙත යැවීම

2.5. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාර්ෂිකව හා අර්ධ වාර්ෂිකව සකස් කරන මහ බැංකු වාර්තාව සඳහා අවශ්‍ය තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සකස් කර යැවීම.

2.6. අමාත්‍යාංශය යටතේ ඇති සියලු ආයතනවල තොරතුරු එක්රැස් කරගනිමින් අදාල ආකෘති පත්‍රයට හා අමාත්‍යාංශය සඳහා වෙන්කර ඇති ඇස්තමේන්තුවට අනුව අමාත්‍යාංශ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.

2.7. ක්‍රියාකාරී සැලැස්මට අනුව අමාත්‍යාංශය යටතේ ඇති සියලු ආයතනවල ක්‍රියාත්මක ව්‍යාපෘති/ වැඩසටහන්/ ක්‍රියාකාරකම්/ප්‍රසම්පාදන කටයුතු හා අනෙකුත් ක්‍රියාකාරකම් වල කාර්තුමය ප්‍රගතිය ඇතුලත් කර සකස් කිරීම හා රජයේ විගණණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම

2.8. ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙතින් ලබා දී ඇති ආකෘති පත්‍රයට අනුව කාර්තුමය ප්‍රගති වාර්තා සකස් කර ඉදිරිපත් කිරීම.

2.9. රු.මි. 1000ට වැඩි මහා පරිමාණ මෙගා ව්‍යාපෘති වල මාසික ප්‍රගතිය ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලදි.

2.10. හදිසි අවස්ථා පෙර සූදානම සඳහා වූ තාක්ෂණික සහයෝගීතාව/එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන යටතේ 2016 මැයි මස 16 දින අප විසින් අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම අනුව 2019 වර්ෂයේ දී ආපදා කලමනාකරණ මධ්‍යස්ථානයේ ජාතික හදිසි අවස්ථා ක්‍රියාත්මක සැලැස්ම සම්පූර්ණ කිරීම , ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයට ප්‍රාදේශීය මට්ටමින් අවිනිශ්චිත අවස්ථා සඳහා වූ සැලැස්ම ද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වෙනුවෙන් නියගයෙන් වන බලපෑම සම්බන්ධ අධීක්ෂණ පද්ධතියක් වැඩිදියුණු කිරීමට තාක්ෂණික සහාය ලබාදෙන ලදි. ඒ සඳහා රු.මි.13.27 ක් වැය කරන ලදි.

2.2. සෙන්දායි රාමුව - 2015 – 2030

ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් 2005-2015 කාලය තුලදී ක්‍රියාත්මක කරන ලද හියුගෝ ක්‍රියාකාරී සැලැස්මෙහි (HFA) අඩුපාඩු සහ උගත් පාඩම් සැලකිල්ලට ගනිමින් 2015-2030 කාල වකවානුව සඳහා ආපදා අවදානම අවම කිරීම සඳහා වූ සෙන්දායි රාමුව (Sendai Framework for Disaster Risk Reduction-SFDRR)) යදුන්වා දී ක්‍රියාත්මක වෙමින් පවති. මෙය ප්‍රමුඛතාවයන් හතරකින් ද ගෝලීය ඉලක්ක හතක් සහ එම ඉලක්ක මැන බැලීම සඳහා වූ නිර්නායක 32 ක් ඇතුලත් වූ ජාත්‍යන්තර සම්මුතියකි. ඒ අනුව 2020 සිට එම ඉලක්ක ළඟාකර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගවල ප්‍රගතිය වාර්තා කල යුතුව ඇත.

මෙම ක්‍රියාකාරී රාමුව ක්‍රියාත්මක කිරීමේ ශ්‍රී ලංකාවේ කේන්ද්‍රීය ආයතනය (Focal Point) ලෙස ආපදා කළමනාකරන විෂය පැවරෙන අමාත්‍යාංශය නම් කර ඇත. ඒ අනුව ආපදා කළමනාකරණ අංශය විසින් පාර්ශවකාර ආයතන සමඟ අවශ්‍ය කටයුතු කරමින් සිටින අතර, ගග ආයතනයේ මෙහෙයුම් පද්ධදිය ද යාවත්කාලීන කරමින් පවති. සෙන්දායි ඉලක්ක 7 න් A සහ B ඉලක්ක දෙක (ආපදා හේතුවෙන් මියගිය පුද්ගල සංඛ්‍යාව හා ආපදා වලින් බලපෑමට ලක්වූ පුද්ගල සංඛ්‍යාව) සඳහා වර්ෂ 2000 සිට 2019 දක්වා තොරතුරු සපයා සම්පූර්ණ කර ඇත.

ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය

1. හැඳින්වීම

සමාජ සේවා සහ සුබසාධන අමාත්‍යාංශය යටතේ 1996 වසරේදී ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය (NDRSC) ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ලෙස ස්ථාපනය කෙරිණි. අංක 1422/22 හා 2005.12.08 දිනැති ගැසට් නිවේදනයෙන් එය ආපදා, පුනරුත්ථාපන සහ යළි ඉදිකිරීමේ කටයුතු සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමට ආපදා සහ සහන සේවා මධ්‍යස්ථානය යටතට ගෙන එනු ලැබීය. 1482/9 හා 2007.01.09 දිනැති ගැසට් නිවේදනයෙන් එය ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය ලෙස නම් කෙරුණු අතර නැවත පදිංචි කිරීමේ සහ ආපදා සහන සේවා අමාත්‍යාංශය යටතට ගෙන එනු ලැබීය. 1651/220 සහ 2010.04.30 දිනැති ගැසට් නිවේදනය අනුව එය ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ කොළඹ 07 විද්‍යා මාවතේ වන අතර ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ ඇමතිවරයාගේ උපදෙස් සහ මඟ පෙන්වීම යටතේ ක්‍රියා කරයි. ආපදා කළමනාකරණ විෂයය භාර අමාත්‍යාංශය විසින් දෙනු ලබන උපදෙස් අනුව අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් හරහා එහි ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙයි. සහන කටයුතු, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ ආපදා සහන සේවා නිලධාරීන්ගේ සම්බන්ධීකරණයෙන් දියත් කෙරේ.

1.4. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් හඳුනාගන්නා ලද ප්‍රමුඛතාවන්

1. ආපදා සහන සේවා, පුනරුත්ථාපන සහ යළි ඉදිකිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම්
2. ආපදා සහන තොරතුරු යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සහ සංවර්ධනය කිරීම.
3. මහජන දැනුවත්කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
4. යහපාලනය සහතික කිරීම.

1.5 ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය

අනුක්‍රමික අංකය	තනතුර	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
	ජ්‍යෙෂ්ඨ මට්ටම			
1	අධ්‍යක්ෂ	1	1	0
2	නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (ශ්‍රීලපසේ)	6	3	3
3	නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (ශ්‍රීලකසේ)	1	0	1
4	ගණකාධිකාරී (ශ්‍රීලංගසේ)	1	1	0
	එකතුව	9	5	4
	තෘතීය මට්ටම			
1	පරිපාලන නිලධාරී	1	1	0
	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නිලධාරී (11 ශ්‍රේණිය)	2	1	1
	එකතුව	3	2	1
	ද්විතියක මට්ටම			
1	සංවර්ධන සහකාර/සංවර්ධන නිලධාරී (ආපදා කළමනාකරණ/ආපදා සහන සේවා)	364	347	17
2	කළමනාකරණ සහකාර	8	6	2
3	ව්‍යෘති නිලධාරී	1	0	1
4	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නිලධාරී (111 ශ්‍රේණිය) (දත්ත ඇතුල් කිරීමේ ක්‍රියාකාරු)	1	1	0
	එකතුව	376	353	20
	ප්‍රාථමික මට්ටම			
1	රියැදුරු	7	5	2
2	කාකාසේ	4	2	2
3	ලොරි රථ රියැදුරු සහායක	5	4	1
	එකතුව	16	11	5
	එකතුව	402	372	30

2. සහන කටයුතු සඳහා අරමුදල් සැපයීම.

ස්වාභාවික හා මිනිසා විසින් ඇති කරන ලද ආපදාවන්ට ගොදුරු වූවන්ට රජය ප්‍රධාන සහන කාණ්ඩ දෙකක් යටතේ ප්‍රතිපාදන ලබා දුන්නේය.

1. භාණ්ඩාගාරය හරහා ලබාදුන් ප්‍රතිපාදන (වගුව 01)
2. ජාතික රක්ෂණ භාර අරමුදල (NITF) හරහා ජාතික ස්වභාවික ආපදා රක්ෂණ ක්‍රමය (NNIDS) යටතේ සපයන ලද ප්‍රතිපාදන

වගුව **01:** භාණ්ඩාගාරය විසින් ලබාදුන් ප්‍රතිපාදන- **2019**

අංකය	විස්තරය	වෙන්කිරීම (රු)	වියදම (රු)
01	**පුනරාවර්තන වියදම්**	998,343,000.00	708,796,603.72
02	**ප්‍රාග්ධන වියදම්**	3,979,252,000.00	2,231,582,191.06
එකතුව		**4,977,595,000.00**	4,977,595,000.00

මූලාශ්‍රය: NDRSC

3. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ හඳුනාගත් ප්‍රමුඛතා යටතේ ඔවුන්ගේ ප්‍රගතිය - 2019

3.1. ආපදා සහන, ප්‍රතිචාරය, පුනරුත්ථාපනය සහ යළි ගොඩනැංවීමේ මෙහෙයුම්.

3.1.1 කාර්යක්ෂම හා ඵලදායී ආපදා සහන සේවාවක් ක්‍රියාත්මක කිරීමෙන් ආපදාවෙන් පීඩාවට පත් ප්‍රජාවන්ට ක්ෂණික සහනයක් ලබා දීම.

3.1.2 ආපදාවන්ගෙන් හානියට පත් නිවාස හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන්දි ලබා දීම.

3.1.3 නායයෑම්වලින් නිවාස වලට හානි වූ පවුල් සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් හඳුනාගෙන ඇති නායයෑම් සහිත අවදානම් සහිත ප්‍රදේශවල ජීවත් වන පවුල් නැවත පදිංචි කිරීම (ආපදා අවදානම හඳුනාගැනීම සහ අපදාව සිදුවී වසරක් ඇතුළත එම පවුල් ආරක්ෂිත ස්ථානයක නැවත පදිංචි කරවීම)

3.1.4 අධික වියළි කාලගුණික තත්ත්වයන්ගෙන් පීඩාවට පත් ජනතාවට පානීය ජලය සැපයීම සහ පීඩාවට පත් ජනතාව සඳහා විශේෂ සහන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

3.1.5 ආරක්ෂක මධ්‍යස්ථානවල මූලික පහසුකම් වැඩි දියුණු කිරීම සහ සංවර්ධනය කිරීම.

3.1.6 සපයනු ලබන සේවාවන්හි ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා පශ්චාත් ආපදා සහන සහ ප්‍රතිචාර සේවාවන්හි සක්‍රීය සහන නිලධාරීන් සන්නද්ධ කිරීම සඳහා ධාරිතා වර්ධන වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

3.1.1. කාර්යක්ෂම හා ඵලදායී ආපදා සහන සේවාවක් ක්‍රියාත්මක කිරීමෙන් ආපදාවෙන් පීඩාවට පත් ප්‍රජාවන්ට ක්ෂණික සහනයක් ලබා දීම.

ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය ආපදාවක් සිදු වූ විගසම ප්‍රතිචාර දක්වයි. ආපදා තත්ත්වයේ සිටම පීඩාවට පත් ජනතාවට පිසූ ආහාර ලබා දෙන අතර ආපදා තත්ත්වය අඛණ්ඩව වර්ධනය වුවහොත් වින්දිතයින් ආරක්ෂක මධ්‍යස්ථාන වෙත යොමු කරනු ලැබේ. ආපදා තත්ත්වය අවසන් වන තුරු සහ ආරක්ෂිත මධ්‍යස්ථානවල රැඳී සිටින කාලය

තුළ ඔවුන්ගේ මූලික අවශ්‍යතා සපුරාලන තෙක් ආපදා වින්දිතයින් ආරක්ෂක මධ්‍යස්ථානවල රඳවා ගනු ලැබේ.

- **ජාතික ස්වාභාවික ආපදා රක්ෂණ ක්‍රමය (NNDIS) යටතේ හදිසි සහන සහ වන්දි ලබා දීම**

2016 අප්‍රේල් 1 වනදා සිට (NNDIS) දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරන ලදී. 2019 වසරේදී රජය රු.මි. 1,500 ක වාර්ෂික මුදලක් ලබාදෙන ලදී. වාර්ෂික රක්ෂණාවරණය රු.බිලියන 15 ක් වන අතර එ අතුරින් රු. බිලියන 2.5 ක් හදිසි සහනවලට ලබාදී ඇති අතර ස්වභාවික විපත් මගින් සිදුවන නිවාස හානි සහ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර හානි සඳහා රු.බිලියන 12.5 ක් වෙන් කර ඇත. සුනාමි, භූමිකම්පා, ගංවතුර, නායයෑම්, අකුණු හා සුළි සුළං වැනි ස්වාභාවික විපත් වලින් පීඩාවට පත් පුද්ගලයින් NNDIS මගින් ආවරණය වන නමුත් නියඟය, ගින්න සහ මිනිසා විසින් ඇති කරන ලද ආපදා ආවරණය නොකෙරේ.

වගුව 02: NNDIS යටතේ සපයනු ලබන හදිසි අවස්ථා සහන සහ වන්දි

පිසූ ආහාර (දිනකට)	රු. 300.00				
වියළි ආහාර ද්‍රව්‍ය (පවුලකට)	රු.900 (එක් පුද්ගලයෙකුට)	රු.12000 (සාමාජිකයින් දෙදෙනෙකුට)	රු.1400 (සාමාජිකයින් තිදෙනෙකුට)	රු.1600 (සාමාජිකයින් සිව් දෙනෙකුට)	රු.1800 (සාමාජිකයින් පහකට වැඩි)
මරණ/ආබාධිත වීම	රු. 250,000.00 (උපරිම)				
නිවාස හානි	රු. 2,500,000.00 (උපරිම)				
නිවාස උපකරණ	රු. 25000.00 (උපරිම)				
කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හානි	රු. 2,500,000.00 (උපරිම)				
කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අන්තර්ගතයන්	රු. 100000.00 (උපරිම)				

මූලාශ්‍රය: NDRSC

- **හදිසි අවස්ථා සහන සේවාවන් සැපයීම**

2019 දී ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ස්වාභාවික විපත් වලින් පීඩාවට පත් වූවන්ගේ සංඛ්‍යාව පවුල් 510476 න් 1821152 ක් වන අතර පවුල් 28003 ක 105914 දෙනාගෙන් ආරක්ෂිත මධ්‍යස්ථාන 475 ක රඳවාගෙන ඇත. වාර්තා වූ මරණ සංඛ්‍යාව 96 කි. සම්පූර්ණයෙන්ම හානියට පත් නිවාස සංඛ්‍යාව 562 ක් වන අතර අර්ධ වශයෙන්

හානි වූ නිවාස සංඛ්‍යාව 29799 කි; හානියට පත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංඛ්‍යාව 1140 කි.

ආපදා තත්ත්වය යථා තත්ත්වයට පත්වන තෙක් ආරක්ෂක මධ්‍යස්ථානවල රඳවා සිටින ජනතාවගේ පිසින ලද ආහාර, පානීය ජලය, වියළි සලාක සහ මූලික අවශ්‍යතා සැපයීම සඳහා NNDIS යටතේ වෙන් කර ඇති හදිසි සහන අරමුදල් භාවිතා කරනු ලැබේ; NNDIS මගින් ආවරණය නොවන ආපදා සඳහා, ඉහත සඳහන් සේවාවන් සඳහා අරමුදල් සපයනු ලබන්නේ භාණ්ඩාගාර ප්‍රතිපාදන විසිනි (වගුව 03 තුළ විස්තර දක්වා ඇත).

වගුව 03: හදිසි සහන සහ ප්‍රතිචාර සේවා - වියදම් (2019)

විස්තරය	NNDIS (රු.)	භාණ්ඩාගාර අරමුදල් (රු)
ඉක්මන් සහන	120,006,862.62	1,185,300.00
මරණ වන්දි	6,950,000.00	අ/නො
හදිසි ප්‍රතිචාර	අ/නො	30,088433.00
එකතුව	126,956,862.62	31,273,733.00

මූලාශ්‍රය: NDRSC

3.1.2. NNDIS යටතේ නිවාස හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන වන්දි ගෙවීම

නිවාස හා නිවාස උපකරණ හානි සඳහා උපරිම වන්දි මුදල රු. මිලියන 2.5 ක් (තාක්ෂණික කමිටු හානි තක්සේරුව මත පදනම්ව). නිවාස හා නිවාස උපකරණ හානි සඳහා ලබා දී ඇති උපරිම වන්දි මුදල රු. 25,000.00 ක් වන අතර වාර්ෂික පිරිවැටුම රු. මිලියන 10 ක් සඳහා උපරිම වන්දි මුදල මිලියන 2.5 කි (තාක්ෂණික කමිටුවේ හානිය තක්සේරු කිරීම මත පදනම්ව). තොග නැතිවීම සහ යන්ත්‍රෝපකරණ වලට සිදුවන හානිය සඳහා උපරිම වන්දි මුදල රු.100,000.00 කි. රු. 10,000.00 කට වඩා හානියට පත් නිවාසවල අයිතිකරුවන්ට වහාම රු. 10,000.00 ක අත්තිකාරමක් ගෙවනු ලැබේ; හානිය රු. 10,000.00 කට අඩු නම්, හිමිකම් ඇති නිශ්චිත මුදල අයිතිකරුට ගෙවනු ලැබේ.

වගුව 04: NNDIS යටතේ නිවාස හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන වන්දි ගෙවීම

විස්තරය		2018		2019.11.25 දක්වා	
		හිමිකම් ගණන	වෙන්කිරීම (රු)	හිමිකම් ගණන	වෙන්කිරීම (රු)
අත්තිකාරම් ගෙවීම (රු.10,000.00 දක්වා)		23,130	298, 651,700.00	24059	226,669,254.19
නිවාස හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා	නිවාස	5,564	215,125,212.50		
	නිවාස උපකරණ	134	997,919.00		

වන වන්දි ගෙවීම	කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර - ගොඩනැගිලි	189	5,555,607.20	4,602	179,358,389.00
	කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අන්තර්ගතයන්	334	9,127,470.00		
එකතුව		**29,351**	**529,457,899.70**	**28,661**	**406,027,644.14**

මූලාශ්‍රය: NDRSC

3.1.3. නායයෑම්වලින් නිවාස වලට හානි වූ පවුල් සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් හඳුනාගෙන ඇති නායයෑම් සහිත අවදානම් සහිත ප්‍රදේශවල ජීවත් වන පවුල් නැවත පදිංචි කිරීම (ආපදා අවදානම හඳුනාගැනීම සහ අපදාව සිදුවී වසරක් ඇතුළත එම පවුල් ආරක්ෂිත ස්ථානයක නැවත පදිංචි කරවීම)

කෑගල්ල දිස්ත්‍රික්කයේ 2016 දී සහ සහ තවත් දිස්ත්‍රික්ක කිහිපයක 2017 සිදුවූ නායයෑම් වලට ප්‍රතිචාර වශයෙන් ජාතික ගොඩැනැගිලි පර්යේෂණ සංවිධානය නායයෑම්වලින් පීඩාවට පත් පවුල් සහ නායයෑම් අවදානම් සහිත ප්‍රදේශවල වෙසෙන පවුල් හඳුනාගෙන තිබේ. පසුව අදාළ පවුල් ආරක්ෂිත ස්ථානවල නැවත පදිංචි කිරීම සඳහා නැවත පදිංචි කිරීමේ වැඩසටහන ආරම්භ කරන ලදී. දිස්ත්‍රික්ක 14 ක් තුළ මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

පීඩාවට පත් පවුල් සහ නායයෑම් සහිත අවදානම් සහිත ප්‍රදේශවල පදිංචිව සිටින පවුල් නැවත පදිංචි කරවීම සඳහා ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණ අනුව, බදුල්ල, නුවරඑළිය, කෑගල්ල, මහනුවර, මාතලේ, කළුතර මාතර, රත්නපුර, හම්බන්තොට, කොළඹ, ගම්පහ, කුරුණෑගල සහ මොණරගල දිස්ත්‍රික්ක තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 121 ක පදිංචිව සිටින පවුල් 15,025 ක් දැනට ජාතික ගොඩනැගිලි පර්යේෂණායතනය විසින් ප්‍රතිලාභීන් ලෙස හඳුනාගෙන ඇත. අදාළ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ මෙම වැඩසටහන දැනට ක්‍රියාත්මක වේ.
මෙම සන්දර්භය තුළ, එන්බීආර්ඕ විසින් හඳුනාගෙන ඇති අදාළ ප්‍රතිලාභී පවුල් 11, 517 ආරක්ෂිත ස්ථානවල නැවත පදිංචි කිරීම සඳහා NDRSC විසින් එහි තාක්ෂණික මග පෙන්වීම සහ සහාය ඇතිව නැවත පදිංචි කිරීමේ වැඩසටහන සඳහා අරමුදල් සපයමින් සම්බන්ධීකරණ කටයුතු සිදු කරයි.

අමාත්‍ය මණ්ඩල තීරණ අනුව, නැවත පදිංචි කිරීමේ වැඩසටහන සඳහා සුදුසුකම් ලබන ප්‍රතිලාභීන් සඳහා විකල්ප තුනක් ලද හැකිය;

විකල්පය 1: රු. නිවසක් සහිත සුදුසු ඉඩමක් මිලදී ගැනීම සඳහා මිලියන 1.6 ක් ලබා දෙනු ඇත.

විකල්පය 02: රජයේ ඉඩම නොමැති නම්, නිවස ඉදිකිරීම සඳහා ලබා දී ඇති මිලියන 1.2 ට අමතරව සුදුසු ඉඩමක් මිලදී ගැනීම සඳහා අතිරේක මිලියන 0.4 ක් ලබා දෙනු ඇත.


විකල්පය 03: රජය විසින් ඉඩම් කැබැල්ලක් (දළ වශයෙන් පර්චස් 10 ක්) ලබා දෙන්නේ නම්, ප්‍රතිලාභීන්ට නිවස ඉදිකිරීම සඳහා රු. මි .1.2 ක් නිම කිරීමේ අදියර මත පදනම්ව වාරික හතරකින් (04) ලබා දෙනු ඇත.

තවද, නැවත පදිංචි කිරීම සඳහා තෝරාගෙන ඇති රජයට අයත් ඉඩම්වල යටිතල පහසුකම් (NBRO විසින් හඳුනාගෙන ඇත) මෙම වැඩසටහන යටතේ සංවර්ධනය කර ඇත.
කෑගල්ල දිස්ත්‍රික්කයේ 2016 සිට නැවත පදිංචි කිරීමේ මෙහෙයුම් යටතේ පවුල් 1689 න් 1647 ක් ආරක්ෂිත ස්ථානවල නැවත පදිංචි කර ඇත. මුළු වියදම රු. මිලියන 1,949.41 කි. 2017 සිට මේ දක්වා නැවත පදිංචි කිරීමේ වැඩ සටහනේ මුළු වියදම රු. බිලියන 3,040.22; නිශ්චිත තොරතුරු පහත වගුවේ දක්වා ඇත: 05.

වගුව 05: 2017 වසරේදී ආරම්භ කළ නැවත පදිංචි කිරීමේ වැඩසටහනේ ප්‍රගතිය

අංකය.	දිස්ත්‍රික්කය	නැවත පදිංචි කිරීම සඳහා සුදුසුකම් ලබන පවුල් සංඛ්‍යාව	ඉඩමක් සහිත (රජයෙන් ලබාදුන්/ඔවුන්ට හිමි) පවුල් සංඛ්‍යාව	ඉදිකෙරෙමින් පවතින නිවාස ගණන	සම්පූර්ණ කළ නිවාස ගණන
1	හම්බන්තොට	106	87	28	59
2	ගාල්ල	353	265	119	144
3	මාතර	419	294	84	206
4	රත්නපුර	2,277	984	435	223
5	කෑගල්ල	183	131	20	57
6	කළුතර	1,694	690	242	446
7	මහනුවර	1,278	290	272	9
8	බදුල්ල	3,608	538	43	3
9	මාතලේ	472	153	82	1
10	නුවර එළිය	1,088	818	109	0
11	කුරුණෑගල	8	3	0	3
12	ගම්පහ	9	3	0	3
13	මොණරාගල	7	4	4	0
14	කොළඹ.	16	2	0	2
එකතුව		**11,518**	**4,262**	**1,438**	**1,156**

මූලාශ්‍රය: NDRSC



ගංවතුර, නායයෑම් සහ නායයෑම් හේතුවෙන් සහ නායයෑම් ඉහළ අවදානම හේතුවෙන් අවතැන් වූ පවුල් නැවත පදිංචි කිරීම (ස්ථාන සිතියම - නිවිතිගල නැවත පදිංචි කිරීමේ බිම)



මූලාශ්‍රය: NDRSC

3.1.4. අධික වියළි කාලගුණික තත්ත්වයන් නිසා ඇතිවන අහිතකර බලපෑම අවම කිරීම සඳහා පානීය ජලය සහ වෙනත් පහසුකම් සැපයීම.

මෑත අතීතයේ දිවයිනේ කලාප කිහිපයක පැවති අධික වියළි කාලගුණය හේතුවෙන් සැලකිය යුතු පිරිසකට ඔවුන්ගේ දෛනික පානීය ජල අවශ්‍යතා සපුරාගැනීමට නොහැකි විය. බලපෑමට ලක්වූ මුළු පවුල් සංඛ්‍යාව 2017 දී 1,1,13858 කි. 2018 දී එය 567,987 ක් සහ 2019 දී 312,383 ක් විය. පීඩාවට පත් ප්‍රජාවන්ට පානීය ජලය බෙදා හැරීම පහසු කිරීම සඳහා අදාළ දිස්ත්‍රික්කවලට ලොරි බවුසර් 133 ක්, ට්‍රැක්ටර් බවුසර් 364 ක් සහ ජල ටැංකි 11936 ක් ලබා දී ඇත. 2019 දී පානීය ජලය බෙදා හැරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට රු. මිලියන 124.33 ක් වෙන් කර නිදහස් කරන ලදී.

3.1.5. ආරක්ෂක මධ්‍යස්ථානවල පහසුකම් වැඩි දියුණු කිරීම සහ සංවර්ධනය කිරීම.

2018 දී, ආරක්ෂක මධ්‍යස්ථානවල රඳවාගෙන සිටින පීඩාවට පත් ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරාලීම සහ ආපදා කාලවලදී ආරක්ෂක මධ්‍යස්ථානවල ආරක්ෂිත සහ සුවපහසු වාතාවරණයක් ඇති කිරීම සඳහා,ආරක්ෂක මධ්‍යස්ථාන 325 ක යටිතල පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. මුලපිරීම සඳහා ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 325.25 ක් වන අතර එයින් රු. මිලියන 102 ක් 2018 දී මේ සඳහා යොදවා ඇත; දිස්ත්‍රික් 20 ක ප්‍රාදේශීය ලේකම් කාර්යාල 106 ක පිහිටි ආරක්ෂක මධ්‍යස්ථාන 164 ක් වැඩිදියුණු කිරීම සඳහා රුපියල්මි ලියන 92.47 ක් වැය කර ඇත. 2019 දී සංවර්ධනය කිරීමට

සැලසුම් කර ඇති ආරක්ෂක මධ්‍යස්ථාන සංඛ්‍යාව 99 ක් වූ අතර මුලපිරීම සඳහා රු. මිලියන 100 ක් වෙන් කරන ලදී; රු. මිලියන 78.23 වැය කරමින් මධ්‍යස්ථාන 99 ක ඉදිකිරීම් මේ වන විට අවසන් කර ඇත.

3.1.6. සපයනු ලබන සේවාවන්හි ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා පශ්චාත් ආපදා සහන සහ ප්‍රතිචාර සේවාවන්හි සක්‍රීය සහන නිලධාරීන් සන්නද්ධ කිරීම සඳහා ධාරිතා වර්ධන වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. (ආපදා සහන සේවා තොරතුරු යටිතල පහසුකම් ශක්තිමත් කිරීම).


2013 දී හඳුන්වා දුන් ආපදා සහන මෙහෙයුම් සැලැස්ම එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන මගින් ලබා දෙන නොමසුරු තාක්ෂණික සහාය ඇතිව ආපදා සහන සහ ප්‍රතිචාර සේවා කාර්යක්ෂමව සැපයීම සඳහා පහසුකම් සැලසීම සඳහා 'සහන සහ ප්‍රතිචාර සූදානම් කිරීමේ සැලැස්මක්' (ආපතිකතා සැලැස්මක්) ලෙස 2017 දී නැවත සලකා බලන ලදී. අවිනිශ්චිත සැලැස්මේ තොරතුරු පෝෂණය කිරීම සඳහා මාර්ගගත පද්ධතියක් සකස් කරන ලදී. අදාළ කොට්ඨාසවල සහන අවශ්‍යතා හඳුනා ගැනීමට සහ .ලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමට පාර්ශවකරුවන්ට සහ අදාළ පාර්ශ්වයන්ට පහසුකම් සැලසීම හා සන්නිවේදනය කිරීම මෙමඟින් සිදු කෙරේ. අදාළ මාර්ගගත පද්ධතිය හොඳින් සංවර්ධනය කර ඇති අතර ආපදා සම්බන්ධ මෙහෙයුම් සඳහා අවශ්‍ය සියලු තොරතුරු වෙබ් අඩවියට පිවිසීමෙන් පද්ධතියට සපයනු ලැබේhttp://contingency-planning.ndrsc.lk . ආපතිකතා සැලැස්ම වාර්ෂිකව යාවත්කාලීන වන අතර සහන මෙහෙයුම් වැඩි දියුණු කිරීම සඳහා එය සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ආපදා ආශ්‍රිත මෙහෙයුම් වල නියැලී සිටින අදාළ නිලධාරීන්ට විධිමත් පුහුණුවක් හා අභ්‍යාසයක් ආරම්භ කිරීමෙන් අවිනිශ්චිත සැළැස්ම ක්‍රියාත්මක කිරීම තවදුරටත් සංවර්ධනය කෙරේ. WFP විසින් අරමුදල් සපයන ලද එවැනි පුහුණු වැඩසටහන් සහ වැඩමුළු 2019 දී පවත්වන ලදී.

මාර්ගගත පද්ධතියේ සටහන් කර ඇති තොරතුරු පහත විස්තර කෙරේ.

- ආපදාවකදී සහන කටයුතුවලට සෘජුවම සම්බන්ධ වූ නිලධාරීන්ගේ සන්නිවේදන තොරතුරු.
- අදාළ ග්‍රාම නිලධාරිවරුන්ගේ සන්නිවේදන තොරතුරු.
- අවදානමට ලක්විය හැකි ප්‍රදේශ ආදේශකරණය, ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටම දක්වා.
- ග්‍රාම සේවා කොට්ඨාසයක් තුළ පවුල් ගණනාවක්ට බලපෑම් ඇති විය හැකිය.
- ඓතිහාසික දත්ත විශ්ලේෂණය මත පදනම් වූ විභව්‍ය බලපෑම් අවස්ථා (බලපෑමට ලක්වූ දත්ත)
- ප්‍රදේශයේ අවදානමට ලක්විය හැකි පවුල් සඳහා නවාතැන් ගත හැකි ආරක්ෂක මධ්‍යස්ථාන පිළිබඳ විස්තර.
- ආරක්ෂක මධ්‍යස්ථානවල සම්බන්ධීකරණ කමිටුවල තොරතුරු සහ සම්බන්ධතා තොරතුරු.
- ඉදිරියේදී සංවර්ධනය කිරීමට යෝජිත ආරක්ෂක මධ්‍යස්ථාන පිළිබඳ තොරතුරු.
- ආරක්ෂක මධ්‍යස්ථාන වෙත සේවා සපයන පුද්ගලයින්ගේ තොරතුරු.

- ආපදා වලදී අවශ්‍ය වන ප්‍රක්ෂේපිත ආහාර, ආහාර නොවන ද්‍රව්‍ය සහ මූලික අවශ්‍යතා පිළිබඳ විස්තර.

NDRSC නිල වෙබ් අඩවිය හරහා මහජනතාවට මෙම තොරතුරු ලබා ගත හැකිය http://www.ndrsc.lk/.



4. 2020 සඳහා ප්‍රක්ෂේපිත ව්‍යාපෘති හා වැඩසටහන්

වගුව 06: 2020 සඳහා ප්‍රක්ෂේපිත ව්‍යාපෘති හා වැඩසටහන්

ව්‍යාපෘති විස්තරය	තක්සේරුගත වියදම (රු)	අපේක්ෂිත වියදම (රු)
කෑගල්ල දිස්ත්‍රික්කයේ නිවාස ඉදිකිරීම	මිලියන 2,838	මිලියන 30
අධි අවදානම් ප්‍රදේශවල ජීවත් වන පවුල් නැවත පදිංචි කරවීම	මිලියන 21,050	මිලියන 200
ආරක්ෂක මධ්‍යස්ථානවල පහසුකම් වැඩි දියුණු කිරීම	මිලියන 325	මිලියන 30
ගංවතුර සහ නාය යෑම් විසින් හානි වූ මාර්ග නැවත ඉදිකිරීම	මිලියන 2,108	ප්‍රතිපාදන ලද නොහැක

5. ඉදිරි සැලසුම්

1. වඩාත් ආපදාවන්ට ලක්විය හැකි දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අතිරේක සහන නිලධාරියෙකු අනුයුක්ත කරන්න.
2. ඵලදායී හා කාර්යක්ෂම සන්නිවේදනයක් සඳහා පහසුකම් සැලසීම සඳහා සන්නිවේදන දීමනාවක් ගෙවීම හෝ නිල ජංගම සිම්කාඩ් එකක්, සංවිධානය විසින් NDRSC නිලධාරීන්ට ගෙවන කුලිය නිකුත් කිරීම.
3. හානිය තක්සේරු කිරීමේ ක්‍රියා පටිපාටි පිළිබඳ තාක්ෂණික පුහුණුව, NNDIS යටතේ හානිය තක්සේරු කිරීමේ නිරත නිලධාරීන් සඳහා
4. ආපදා සහන සේවා ඔන්ලයින් තොරතුරු පද්ධතිය ශක්තිමත් කිරීම සහ තවදුරටත් සංවර්ධනය කිරීම සහ තොරතුරු කළමනාකරණයේ යෙදී සිටින නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය.
5. දැනටමත් පුනරුත්ථාපන වැඩසටහන ක්‍රියාත්මක වන අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා නියමු ව්‍යාපෘති ලෙස කළුතර සහ රත්නපුර දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වන පෙරැදි කොන්ක්‍රීට් නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය හඳුන්වා දීම.

වර්ෂය සඳහා සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

2019

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

ඒඑසීඒ-එෆ්

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

Rs.

අයවැය 2019		සටහන	තක්ෂ 2019	2018	
	ආදායම් ලැබීම්				
-	ආදායම් බදු	**1**	-	-	ACA-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
960,000,000	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	1,069,071,156	1,150,252,462	
960,000,000	**මුළු ආදායම් ලැබීම් (අ)**		**1,069,071,156**	**1,150,252,462**	
	ආදායම් නොවන ලැබීම්				
-	භාණ්ඩාගාර අග්‍රිම		3,471,674,842	2,973,189,097	ACA-3
-	තැන්පතු		640,206,214	662,440,551	ACA-4
-	අත්තිකාරම් ගිණුම්		117,125,506	78,484,532	ACA-5
-	වෙනත් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**4,229,006,562**	**3,714,114,180**	
960,000,000	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**5,298,077,718**	**4,864,366,642**	
	අඩුකළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
1,099,524,600	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	1,079,726,130	904,117,356	ACA-2(ii)
334,181,400	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	286,951,902	282,883,618	
1,076,220,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	770,800,690	5,945,527,363	
-	පොළී ගෙවීම්	**8**	-	-	
157,857,000	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	157,682,081	263,171	
2,667,783,000	**මුළු පුනරාවර්තන වියදම් (ඇ)**		**2,295,160,803**	**7,132,791,508**	
	මූලධන වියදම්				
48,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	39,817,615	40,354,360	ACA-2(ii)
1,063,700,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	522,770,989	760,556,336	
3,343,500,000	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	2,656,317,475	618,780,000	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
171,200,000	හැකියා වර්ධනය	**14**	162,499,547	106,149,477	
4,537,152,000	වෙනත් මූලධන වියදම්	**15**	2,015,400,537	4,102,169,595	
9,164,052,000	**මුළු මූලධන වියදම් (ඉ)**		**5,396,806,163**	**5,628,009,768**	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		**691,914,839**	**724,460,109**	
	තැන්පතු ගෙවීම්		561,562,575	638,946,373	ACA-4
	අත්තිකාරම් ගෙවීම්		130,352,264	85,513,736	ACA-5
11,831,835,000	**මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)**		**8,383,881,805**	**13,485,261,385**	
	2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)		**(3,085,804,087)**	**(8,620,894,743)**	

රු.

අක්මුදල් ගැලපුම් ගිණුම

10.1	අනෙකුත් දෙපාර්තමේන්තු වලින් එකතු කරගත් ආදායම. (20.02.01.01)	1,045,557,367		අනෙකුත් දෙපාර්තමේන්තු දරන ලද වියදම් . - ACA 2(ii)	4,065,831,393
10.2	අනෙකුත් දෙපාර්තමේන්තු වලින් ලද ප්‍රතිපාදන සඳහා දරන වියදම්. (as per FR.208)	9,985,691	**10.5**	13011 අත්තිකාරම් බී ගිණුමට අනෙකුත් දෙපා./ අමාත්‍ය විසින් කරන ලද හර සටහන් වල මුළු එකතුව	1,891,068
10.3	13011 අත්තිකාරම් බී ගිණුමට අනෙකුත් දෙපා./ අමාත්‍ය විසින් කරන ලද බැර සටහන් වල මුළු එකතුව	34,989,749	**10.6**	අමාත්‍යාංශ විසින් අනෙකුත් අත්තිකාරම් ගිණුම්වලට කරන ලද බැර සටහන් වල මුළු එකතුව	40,292,294
10.4	අමාත්‍යාංශ විසින් අනෙකුත් අත්තිකාරම් ගිණුම්වලට කරන ලද හර සටහන් වල මුළු එකතුව	1,297,495	**10.7**	අමාත්‍යාංශ විසින් අනෙකුත් ආදායම් ගිණුම් වෙනුවෙන් එකතු කරන ලද මුළු එකතුව(ආදායමින් ආපසු ගෙවීම් අඩු කිරීමෙන් පසු)	69,619,634
	අක්මුදල් ගිණුමට මාරුකිරීම්	3,085,804,087			
		4,177,634,389			**4,177,634,389**

රු.

ගෙවිය යුතු අක්මුදල් ශේෂ ගිණුම

මූල්‍ය කාර්ය සාධන ගිණුමෙන් මාරු කිරීම් (ACA F)	3,085,804,087	අක්මුදල් ගැලපුම් ගිණුමෙන් මාරු කිරීම්	3,085,804,087
	3,085,804,087		**3,085,804,087**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2019 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය	
		2019	2018
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	6,999,142,241	6,925,226,714
			-
මූල්‍ය වත්කම්			-
			-
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5 /5(ඒ)	367,236,627	390,848,151
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	
මුළු වත්කම්		**7,366,378,868**	**7,316,074,865**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		45,814,156	111,231,038
දේපළ පිරියත හා උපකරණ සංචිතය		6,999,142,241	6,925,226,714
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)	195,884,064	232,722,345
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	125,538,407	46,894,768
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**7,366,378,868**	**7,316,074,865**

පිටු අංක 1 සිට 48 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 49 සිට 73 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

ඒසීඒ-සී

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2019	**2018**
	රු.	**රු.**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	23,513,789	203,981,746
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	3,116,677,516
වෙනත් දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ මඟින් එකතු කරන ලද ආදායම	69,619,634	
අග්‍රිම ලැබීම්	3,471,674,842	
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**3,564,808,265**	**3,320,659,262**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,183,885,303	995,622,445
සහනාධාර සහ මාරුකිරීම්	36,559,037	236,749,471
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	85,138,464
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	9,985,691	2,634,938
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,230,430,031**	**1,320,145,318**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**2,334,378,234**	**2,000,513,944**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම් - අත්තිකාරම් බී ගිණුම	-	33,423,142
අත්තිකාරම් අයකර ගැනීම්	122,428,051	17,889,968
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**122,428,051**	**51,313,110**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	2,405,691,233	2,000,722,189
අත්තිකාරම් ගෙවීම්	129,758,691	68,353,750
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**2,535,449,924**	**2,069,075,939**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(2,413,021,873)**	**(2,017,762,829)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(78,643,639)**	**(17,248,886)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	640,206,214	
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**640,206,214**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පත් ගෙවීම්	561,562,575	(17,248,886)
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**561,562,575**	**(17,248,886)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**78,643,639**	**17,248,886**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) + (ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදායම් කේතය	ආදායම් කේත විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කළ ආදායම	
		මුල් අගය	සංශෝධිත අගය	අගය (රු.)	සංශෝධිත ආදායම් ඇස්තමේන්තු ප්‍රතිශතයක් ලෙස
20.02.01.01	රජයේ ගොඩනැගිලි හා නිවාස කුලියට දීම	925,000	960,000	1,069,071	111.36

ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	ප්‍රතිපාදනය		තථ්‍ය වියදම්	ප්‍රතිපාදන භාවිතය සංශෝධිත ප්‍රතිපාදන % ක් ලෙස
	මුල් ප්‍රමාණය	සංශෝධිත		
පුනරාවර්තන	2,185,960,000	2,667,783,000	2,295,160,802.94	86.03 %
ප්‍රාග්ධන	4,957,600,000	9,164,052,000	5,396,806,163.35	58.89 %

මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2019 දිනට මිනින්දෝරු වාර්තාවට අනුව ශේෂය	2011.12.31 දිනට මූල්‍ය ස්ථාන වාර්තාවට අනුව ශේෂය	තවම ගණන් ගත යුතු	ප්‍රගතිය% ක් ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි සහ ව්‍යුහයන්		2,335,789,844.94	-	100%
9152	යන්ත්‍රෝපකරණ සහ උපකරණ		1,501,713,510.33	-	100%
9153	ඉඩම්		3,389,180,000.00	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්		-	-	100%
9155	ජීව වත්කම්		-	-	100%
9160	වැඩ කරමින් පවතින		1,020,557,579.73	-	100%
9180	බදු වත්කම්		-	-	100%

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. EHA/C/MPA/01/FS/ 2019/20

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2020 ජූනි 25 දින

ලේකම්,
රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

රාජ්‍ය පරිපාලන හා ආපදා කළමණාකරන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

w. g. m. menike

ඩබ්ලිව්.ජී.එන්. මැණිකේ
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත - අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No.: EHA/C/ MPA/01/FS / 2019/20

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2020 ජූනි 25 දින

ලේකම්
රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

රාජ්‍ය පරිපාලන හා ආපදා කළමණාකරන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

රාජ්‍ය පරිපාලන හා ආපදා කළමණාකරන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය පරිපාලන හා ආපදා කළමණාකරන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් වක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය පරිපාලන හා ආපදා කළමණාකරන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් වක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1. අත්තිකාරම් බී ගිණුමේ අනුමත සීමා ඉක්මවීම.

මුදල් රෙගුලාසි 503 ප්‍රකාරව අත්තිකාරම් ගිණුම් සීමා වෙනස් කිරීමට රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර මුදල් අමාත්‍යවරයා වෙත අනුමැතියට ඉදිරිපත් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ උපරිම වියදම රු.16,989,178 කින් සහ උපරිම හර ශේෂය රු. 50,402,471 කින් සීමා ඉක්මවීම සම්බන්ධයෙන් සහ අවම ලැබීම් සීමාව රු. 25,106,021කින් වැඩිවීම සම්බන්ධයෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

1.6.2 භාණ්ඩාගාර පොත් සමඟ එකඟ නොවීම

2019 වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවේ 3.2.2 රාජ්‍ය ආදායම - බදු නොවන ආදායම්හි, ආදායම් සංකේත 20.02.01.01 ප්‍රකාරව රජයේ ගොඩනැඟිලි හා නිවාස කුලී මූලික ආදායම් ඇස්තමේන්තුව රු. මිලියන 1400 ලෙස දක්වා තිබුණු නමුත් මූල්‍ය ප්‍රකාශනවල ආදායම් ප්‍රකාශයේ මූලික ඇස්තමේන්තුව රු. මිලියන 925 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු. මිලියන 475ක් එනම් සියයට 51.35කින් ආදායම් ඇස්තමේන්තුව අඩුවෙන් දක්වා තිබුණි. "ලේකම්වරයාගේ අදහස් දැක්වීම අනුව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් අමාත්‍යාංශය දැනුවත් කිරීමකින් තොරව සියයට 50 කට වඩා වැඩියෙන් ආදායම් ඇස්තමේන්තුව වැඩිකර තිබුණි."

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

මුදල් රෙගුලාසි 891(1) අනුව අමාත්‍යාංශය විසින් ඇප ලේඛනය පවත්වා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පසුගිය වසර 06 ක හිඟ ආදායම් එකතු කිරීම පිළිබඳ විස්තර පහත පරිදි වේ.

වර්ෂය	හිඟ පියවීමේ ආරම්භක ශේෂය	හිඟ මුදල් එකතු කිරීම	ප්‍රතිශතය
	රු.	රු.	%
2015	212,626,927	45,679,484	21.5
2016	216,564,613	42,855,639	19.8
2017	221,227,142	45,577,330	20.6
2018	188,458,844	30,456,992	16.2
2019	242,896,746	40,273,986	16.6
2020.01.01	249,374,541	-	-

i. 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වර්ෂ 05 ක හිඟහිටි ආදායමේ ආරම්භක ශේෂය අයවීම පිළිවෙලින් රු.මිලියන 45.7 ,42.8 , 45.6, 30.4 ක් හා 40.3 ක් වූයෙන්, වාර්ෂික අයවීම සියයට 22 කට වඩා අඩු ප්‍රතිශතයක් විය. එමෙන්ම හිඟහිටි ආදායමෙන් රු.146,803,677 ක් 2016 දෙසැම්බර් 31 දිනට පෙර පැවති ශේෂය වූ අතර, එය මුළු හිඟහිටි ආදායමෙන් සියයට 59 ක ප්‍රතිශතයක් විය.

ii. ආදායම් අය නොවීමට හේතූන් වශයෙන් වැටුපෙන් අයකර නොතිබීම, විවිධ ආයතන වලින් අය නොවීම, ගිවිසුම් ප්‍රකාරව කුලී ගෙවීම් පැහැර හැරීම, චෙක්පත් ලැබීම ප්‍රමාදවීම, විශ්‍රාම යාමෙන් පසු නිවාස භාර නොදීම, නිවාඩු නිකේතනයන්හි කුලී අය නොවීම, නිලධාරීන් මිය යාම හා වැඩ තහනම්, කුලී අඩුවෙන් අය කිරීම, තක්සේරු වටිනාකම වැඩි වීම යනාදී කරුණු දක්වා තිබුණි.

iii. 2019 ජනවාරි 01 දිනට හිඟ ආදායම් ශේෂය, 2018 ජනවාරි 01 දිනට සාපේක්ෂව රු.54,437,902 කින් එනම් සියයට 29 කින් වැඩි වී තිබුණි.

iv. ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් 2018 වර්ෂය අවසානයේදී රු. 84,815,474 ක ආදායමක් අයවිය යුතුය පැවති අතර, මෙම හිඟ මුදල් අය කර ගැනීමට නිතීමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරගෙන යන බවට 2018 වර්ෂයේදී සඳහන් කර තිබුණද 2019 දෙසැම්බර් 31 දින වන විටත් රු. 93,379,479 ක් අයවිය යුතුව පැවතුණි. එයින් රු. 28,925,825 ක වටිනාකමක් හෙවත් සියයට 31ක් 2019 වර්ෂය තුළ අයවිය යුතු ශේෂයක් විය.

v. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිල්ල ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය වෙත කුලී පදනම මත ලබා දීමෙන් 2009 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා අයවිය යුතු හිඟකුලී රු. 33,465,869 ක් අයකර ගත නොහැකි බව තහවුරු කරගෙන ඇතත්, අවශ්‍ය අනුමැතිය ලබාගෙන ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

vi. රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ හිඟකුලී ආදායම සමාලෝචිත වර්ෂය අවසානයට රු. 64,653,051 වූ අතර එයින් රු. 52,468,166 ක් වූ හිඟ කුලිය 2017 වර්ෂයට වඩා පැරණි ඒවා විය. 2016 වර්ෂයේ දී ගොඩනැගිල්ලෙන් ඉවත් වූ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් අය විය යුතු කුලිය රු. 36,042,000 ක් අයකර ගැනීමට හෝ නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

vii. නිදන්ගත වකුගඩු රෝග වැලැක්වීමේ හා පර්යේෂණ ලේකම් කාර්යාලයට ලබා දී තිබූ රජයේ නිවාසයේ 2017 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ආදායම් ශේෂය රු. 6,450,000 ක් වන අතර 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිඟ හිටි ශේෂයක් දක්වා නොතිබුණි. එසේ වුවද, 2019 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ශේෂය වශයෙන් ගිණුම්ගත

කර ඇත්තේ 2017 වර්ෂය දක්වා හිඟහිටි මුදල සහ සමාලෝචිත වර්ෂයේ කුලී වශයෙන් රු. 9,510,000 පමණි. එම හේතුවෙන් 2018 වර්ෂය සඳහා අයවිය යුතු කුලිය ගිණුම්ගත වී නොතිබුණි.

2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වාර්ෂික ඇස්තමේන්තුව හා සහ මු.රෙ. 66 මාරු කිරීම් මඟින් පුනරාවර්තන වැය විෂයයක් සඳහා සලසා තිබූ ප්‍රතිපාදන රු.10,140,000ක් අදාළ කාර්යයට යොදා නොගෙන සම්පූර්ණයෙන්ම ඉතිරිව තිබුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 15 කට අදාළව මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.118,335,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම වැය විෂයයන්ට අදාළ මුළු වියදම රු. 93,786,592 ක් විය. මුළු ඉතිරිවීම් ප්‍රමාණය රු. 24,548,408 ක් වූ අතර එය සියයට 15ක සිට සියයට 60 ක අතර පරාසයක් තුල පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) මු.රෙ. 66 ප්‍රකාරව වීරමොං ක්‍රියා පටිපාටිය යටතේ ප්‍රතිපාදන මාරු කිරීම සිදුකල හැක්කේ කිසියම් වැය විෂයයක් සඳහා වර්ෂය තුල වෙන්කර ඇති ප්‍රතිපාදන මුදල් වර්ෂය තුළ වියදම් කිරීම සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බව සහ ප්‍රතිපාදන ඉක්මවා යෑමට ඉඩකඩ ඇති බවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා සැහීමකට පත් වූ කල්හි වුව ද එම තත්ත්වයන් සැලකිල්ලට නොගෙන අවස්ථා 14 කදී වෙනත් වැය විෂයයන්ගෙන් ප්‍රතිපාදන මාරුකරගෙන සියයට 35 ක සිට සියයට 100 ක් දක්වා උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

(ඈ) 2019 සැප්තැම්බර් 24 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 5/2019 අනුව ප්‍රාග්ධන වියදම්වලින් සියයට 15ක් සහ 10ක් ලෙස සියයට 25ක් අනිවාර්ය ඉතිරි කිරීම් සිදුකරන ලෙස දන්වා ඇතත් වැය විෂයයයන් 31 ක් සම්බන්ධයෙන් සියයට 10ක ඉතිරි කිරීම් කර නොතිබුණි.

2.3 අත්තිකාරම් ගිණුම් ශේෂ

මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු උපලේඛනය අනුව සමාලෝචිත වර්ෂය අවසන් දිනට සේවය හැර ගිය නිළධාරීන් 11දෙනෙකුගෙන් වර්ෂ 01ට වැඩි ශේෂ රු.783,344 ක් , විශ්‍රාම ගිය නිළධාරීන්ගෙන් වර්ෂ 03ට වැඩි රු. 117,552 ක් හා ද්විතියන පදනම මත මුදා හැර ඇති නිළධාරීන්ගේ වර්ෂ 4 ඉක්මවූ රු.392,775 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ.) 2019 දෙසැම්බර් 31 දිනට සිගාස් වැඩසටහන යටතේ දක්වා ඇති පුනරාවර්තන වැය විෂයයන් 34කට අදාළ බැරකම්වල වටිනාකම රු.30,604,603 ක් වූ අතර 2019 මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම රු.17,685,619 ක් වූයෙන් භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් සහ මූල්‍ය ප්‍රකාශන රු.16,779,208 කින් නොසැසඳුණි.

(ආ.) 2019 දෙසැම්බර් 31 දිනට සිගාස් වැඩසටහන යටතේ දක්වා ඇති මූලධන වැය විෂයයන් 08 කට අදාළ බැරකම්වල වටිනාකම රු.318,763,582 ක් වූ අතර 2019 මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම රු.191,540,521 ක් වූයෙන් භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් සහ මූල්‍ය ප්‍රකාශන රු.127,223,061 කින් නොසැසඳුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මුදල් රෙගුලාසි 216 (අ) විධිවිධානවලට පටහැනිව ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා රු.3,306,880 ක් සම්බන්ධයෙන් බැරකම් සඳහා එකඟ වී තිබුණි.

(ඈ.) 2020 වර්ෂයේ ගෙවීම් වවුවර් පිළිබඳ නියදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ රු.52,794,951 ක බැරකම් 12 ක් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

ආපදා කළමනාකරණ අංශය

---

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඇස්තමේන්තු කිරීමේ දුර්වලතාවයන් හෝ කාර්යයන් නිසි පරිදි සැලසුම් නොකිරීම හේතුවෙන් ප්‍රාග්ධන වැය විෂයයන් 04ක් සඳහා මුල් ඇස්තමේන්තුවෙන් සලසා තිබූ රු.මිලියන 200 කට අමතරව සහ පරිපූරක ඇස්තමේන්තු මගින් ලබාගෙන තිබූ රු.මිලියන 2,782ක ප්‍රතිපාදන සලසා ගෙන සියයට 81 ක සිට සියයට 100 ක පරාසයක් ඉතිරිකර තිබුණි. තවද පුනරාවර්තන වැය විෂයයන් 01 ක් සඳහා මුල් ඇස්තමේන්තුවෙන් සලසා තිබූ රු. මිලියන 200 කට අමතරව පරිපූරක ඇස්තමේන්තුවෙන් රු. මිලියන 439,525 ක ප්‍රතිපාදන සලසා ගෙන සියයට 99 ක් ඉතිරිකර තිබුණි.

(ආ) ප්‍රාග්ධන වැය විෂයයන් 07 කට අදාළව මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනය රු.2,141,700,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම වැය විෂයයන්ට අදාළ මුළු වියදම රු. 1,066,266,557 ක් විය. මුළු ඉතිරිවීම් ප්‍රමාණය රු. 1,075,433,443 ක් වූ අතර එය සියයට 33ක සිට සියයට 100ක් අතර පරාසයක් තුල පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) පුනරාවර්තන වැය විෂයයන් 05 කට අදාළව මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනය රු.10,620,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම වැය විෂයයන්ට අදාළ මුළු වියදම රු. 913,649 ක් විය. මුළු ඉතිරිවීම් ප්‍රමාණය රු. 9,706,351 ක් වූ අතර එය සියයට 35ක සිට සියයට 100 ත් අතර පරාසයක් තුල පැවති බව නිරීක්ෂණය විය.

2.4 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ.) 2019 දෙසැම්බර් 31 දිනට සිගාස් වැඩසටහන යටතේ දක්වා ඇති පුනරාවර්තන වැය විෂයයන් 17කට අදාළ බැරකම්වල වටිනාකම රු.265,731,227 ක් වූ අතර, 2019 මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම රු.271,990,789 ක් වූයෙන් භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් සහ මූල්‍ය ප්‍රකාශන රු.6,548,872 කින් නොසැසඳුණි.

(ආ.) 2019 දෙසැම්බර් 31 දිනට සිගාස් වැඩසටහන යටතේ දක්වා ඇති මූලධන වැය විෂයයන් 09 කට අදාළ බැරකම්වල වටිනාකම රු.713,892,017 ක් වූ අතර 2019 මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම රු.406,406,820 ක් වූයෙන් භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් සහ මූල්‍ය ප්‍රකාශන රු.724,974,998 කින් නොසැසඳුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මුදල් රෙගුලාසි 216 (අ) විධිවිධානවලට පටහැනිව වැය විෂයයන් 05 ක රු.28,301 ක ඉතිරිය ඉක්මවා රු.2,195,549 ක බැරකම් වලට බැඳි තිබුණි.

2.3 නීතිරීති රෙගුලාසි වලට අනුකූල නොවීම.

ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සතුව වාහන 07 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 1645 ප්‍රකාරව පවත්වා ගනු ලබන වාහන ලොග් පොත් සම්පූර්ණ කර නොතිබූ අතර මුදල් රෙගුලාසි 1647 (ඉ) ප්‍රකාරව වාහන සම්බන්ධයෙන් ලැයිස්තුවක් පවත්වා නොතිබුණි. තවද වාහන 05ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 1647 (ආ) ප්‍රකාරව උපකරණ පිළිබඳ සම්පූර්ණ පරීක්ෂාවක් ද කර නොතිබුණු අතර, මාසික සාරාංශ මුල් පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

2.4 පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ වැඩසටහන් අංක 02 යටතේ වර්ෂය තුල අලාභ හා අත්හැරීම පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබූ රු.50,062 ක වටිනාකම ඇතුලත් කරන ලද ලේඛණය විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

2.5 අත්තිකාරම් ගිණුම් ශේෂ

වර්ෂ 02 කට පෙර විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.117,552 ක් වූ ණය ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ

w. g. n. menika
ඩබ්ලිව්.ජී.එන්. මැණිකේ
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත - අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

2019 වර්ෂයේ

අමාත්‍යාංශයීය කාර්යසාධන

දර්ශක

ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය ප්‍රතිදානය		
		100%- 90%	**75%-89%**	**50%- 74%**
1	රාජ්‍ය අංශයේ පුහුණුව ලත් විධායක හා විධායක නොවන නිලධාරීන් සංඛ්‍යාව .		✓	
2	ඒකාබද්ධ සේවාවන්හි අනුමත සේවක සංඛ්‍යාවේ ප්‍රතිශතය (%) ක් ලෙස (SLAS, SLACS, SLPS, SLES, SLSS, SLARCS,) නව බඳවා ගැනීම්, ස්ථානගත කිරීම්, උසස්වීම් සහ මාරුවීම් මගින් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශවල පවත්වාගෙන යනු ලබන සියලුම දීප ව්‍යාප්ත සේවා		✓	
3	ආපදාවන්ට ලක්වූ පුද්ගලයින්ගේ සංඛ්‍යාව අඩු කිරීම ප්‍රතිශතය (%) ක් ලෙස. ආපදා ආර්ථික පාඩු ප්‍රමාණය අඩු කිරීම ප්‍රතිශතය (%) ක් ලෙස.			✓

ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවා අංශය

ප්‍රධාන විෂයය ක්ෂේත්‍රය	ක්‍රියාකාරකම්	අනු ක්‍රියාකාරකම්	අපේක්ෂිත නිමැවුම (ප්‍රතිලාභීන් /)	එක් ක්‍රියාකාරකමකට වැයවන මුළු පිරිවැය (රු.මි.)	ප්‍රතිපාදන (රු.මි.)		භෞතික ඉලක්ක (%)				2019.12.31 දිනට ප්‍රගතිය		මූල්‍ය හා භෞතික ඉලක්ක සපුරා නොගැනීමට හේතු (අනනුකූලතාවක් තිබේ නම්) (D සහ E)
							A 1 වන කාර්තුව	B 2 වන කාර්තුව	C 3 වන කාර්තුව	D 4 වන කාර්තුව	විස්තරය	E ප්‍රගතිය ප්‍රතිශතයක් වශයෙන් හා රු. වලින්	
	ශ්‍රී . ලං. ග.සේවයේ නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණුව (2016-2018 කණ්ඩායම)		පුහුණු කරන ලද ගණකාධිකාරීවරුන් 253	මිලියන 28.75		PT	50%	100%			නිලධාරීන් 244 ක් පුහුණුව සම්පූර්ණ කර ඇත.	96%	2019.12.23 වන දින පත්වීම් ලබාදුන් සේවාරම්භක පුහුණුව ලබා නොදුන් නිලධාරීන් 08 දෙනා නව කණ්ඩායමේ පුහුණුව සඳහා කැඳවනු ඇත. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් එක් (01) අයදුම්කරුවෙකු නුසුදුසු බවට තීරණය කර ඇත.
						FT							
මානව සම්පත	පුරප්පාඩු පිරවීම සඳහා නව නිලධාරීන් 172 ක් බඳවාගැනීම (2017/2019)	* බඳවාගැනීම් නිවේදනය ගැසට් පත්‍රයේ පළ කිරීම *	සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම	මිලියන 0.2 (සම්මුඛ පරීක්ෂණ සඳහා පිරිවැය)		PT		25%	50%	100%	නව බඳවාගැනීම සඳහා ගැසට් නිවේදනය පළ කර තිබේ.	50%	විභාග දෙපාර්තමේන්තුව විසින් 2020 වසරේදී විභාගය පැවැත්වෙනු ඇත.
						FT							

		සම්මුඛ පරීක්ෂණය											
	ශ්‍රී .ලං.ග.සේවයේ නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන පැවැත්වීම I ශ්‍රේණිය - 200 III ශ්‍රේණිය - 360	* ධාරිතා සංවර්ධන වැඩසටහන සඳහා නිලධාරීන් නම් කිරීම	I ශ්‍රේණිය - පුහුණු කරන ලද නිලධාරීන් 200 III ශ්‍රේණිය - පුහුණු කරන ලද නිලධාරීන් 360	I ශ්‍රේණිය - මිලියන 11.4		PT	25%	50%	75%	100%	I ශ්‍රේණිය - නිලධාරීන් 200 දෙනෙක් සහභාගී වූහ.	100%	III ශ්‍රේණියේ නිලධාරීන්ගේ එක් වැඩසටහනක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් අවලංගු කරන ලදී.
				III ශ්‍රේණිය - මිලියන 27.2		FT					III ශ්‍රේණිය - නිලධාරීන් -67 දෙනෙක් සහභාගී වූහ.	19%	
	නියමිත දිනට විශ්‍රාම යෑම්		විශ්‍රාම ගත් නිලධාරීන් 51			PT	25%	50%	75%	100%	නිලධාරීන් 51 දෙනෙක් විශ්‍රාම ගත්හ.	100%	
	විනය පරිපාටි (දැනට සිදු කෙරිගෙන යන පරීක්ෂණ 54)					PT	25%	50%	75%	100%	පරීක්ෂණ 18 ක් සම්පූර්ණ කර තිබේ.	33%	
	කාර්යක්ෂමතා කඩ ඉම් විභාග පැවැත්වීම.	* අයදුම්පත් කැඳවීම * ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් විභාග පැවැත්වීම * ප්‍රතිඵල නිකුත් කිරීම	වසරකට විභාග 2 ක්			PT	25%	50%	75%	100%	2019 ඔක්තෝම්බර් මාසයේදී පළමු කාර්යක්ෂමතා කඩ ඉම් විභාගය පවත්වන ලදී.	50%	එක් විභාගයක් පවත්වන ලදී.
	ශ්‍රී .ලං.ග.සේවයේ නිලධාරීන් නියමිත කාලයට ස්ථිර කිරීම.		නිලධාරීන් 109 දෙනෙකු නියමිත දිනට ස්ථිර කිරීම.			PT	25%	50%	75%	100%	නිලධාරීන් 109 දෙනෙක් ස්ථිර කරන ලදී.	100%	
	නියමිත දිනට I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම.		රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත පදනම් වේ.			PT	25%	50%	75%	100%			(FR187/2014) ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවේ රැඳවීම් නියෝගය හේතුවෙන් රාජ්‍ය

													සේවා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා නොදෙන ලදී.
පාලනය	විශ්‍රාමික නිලධාරීන් සඳහා විශේෂ ශ්‍රේණියට උසස්වීම් සහ වැටුප් වර්ධක ලබා දීම		උසස් කරන ලද නිලධාරීන් සංඛ්‍යාව										(FR187/2014) ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවේ රැඳවීම් නියෝගය හේතුවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා නොදෙන ලදී.

ශ්‍රී ලංකා පරිපාලන සේවා අංශය

ප්‍රධාන විෂයය ක්ෂේත්‍රය	ක්‍රියාකාරකම	අනු ක්‍රියාකාරකම්	අපේක්ෂිත ප්‍රතිඵල (ප්‍රතිලාභීන් / ප්‍ර.කා.ද.)	එක් ක්‍රියාකාරකමකට මුළු පිරිවැය	ප්‍රතිපාදන (රු.මි.)	භෞතික ඉලක්ක (%)					2019.12.31 දිනට ප්‍රගතිය		මූල්‍ය හා භෞතික ඉලක්ක අත් කර නොගැනීම පිළිබඳ ප්‍රතිචාරය (අනනුකූලතාවක් තිබේ නම්)
						භෞ.ඉ.	A	B	C	D	විස්තරය	E	
				(රු.මි.)		මූ.ඉ.	1 වන කාර්තුව	2 වන කාර්තුව	3 වන කාර්තුව	4 වන කාර්තුව		ප්‍රගතිය % හා රු.මි. වශයෙන්	
මානව සම්පත් කළමනාකරණය	නිසි කාලයට නිලධාරීන් සේවයේ ස්ථිර කිරීම	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් 25 දෙනෙක් සේවයේ ස්ථිර කිරීම	ස්ථිර කරන ලද නිලධාරීන් සංඛ්‍යාව	-		භෞ.ඉ.	98%	89%	89%	80%	ලද ඉල්ලීම් සංඛ්‍යාව = 15 අඩු ලිපි ලේඛන කැඳවූ නිලධාරීන් සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන ලද නිර්දේශ සංඛ්‍යාව = 03 01.10.2019 - 31.12.2019 කාලය තුළ ස්ථිර කරන ලද මුළු නිලධාරීන් ගණන =12	89%	
	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් උසස් කිරීම	1. විශේෂ ශ්‍රේණියට උසස් කිරීම (නිලධාරීන් 57)	උසස් කරන ලද නිලධාරීන් සංඛ්‍යාව	-		භෞ.ඉ.	40%	40%	20%	0 20%	* 01.01.2019 දිනට නිලධාරීන් 36 දෙනෙක් උසස් කරන ලද අතර පත් කිරීම් සාර්ථකව සිදු කරන ලදී * විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු සංඛ්‍යාව ගණනය කොට 01.07.2019 දිනට උසස්වීම් සිදු කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා යවන ලදී.	100%	
						මූ.ඉ.		0.144					
	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් උසස් කිරීම	2. II ශ්‍රේණියට උසස් කිරීම (නිලධාරීන් 129)	උසස් කරන ලද නිලධාරීන් සංඛ්‍යාව			භෞ.ඉ.	-	-	70%	100	සංශෝධිත සේවා ව්‍යවස්ථාව අනුව II ශ්‍රේණියට උසස් කිරීම් සිදු කෙරෙමින් පවති. ලද ඉල්ලීම් සංඛ්‍යාව = 126 අඩු ලේඛන කැඳවන ලද නිලධාරීන් සංඛ්‍යාව = 40 සලකා බැලෙමින් පවතින ඉල්ලීම් සංඛ්‍යාව =10 රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යවන ලද ඉල්ලීම් සංඛ්‍යාව =86		

	විශ්‍රාම ගැන්වීම්	විශ්‍රාමයාම් නියමිත කාලයට අනුමත කිරීම (විශ්‍රාම ගැනීම් 65)	විශ්‍රාම ගන්නා ලද නිලධාරීන් සංඛ්‍යාව			හෞ.ඉ.	25%	22%	17%	14%	2019 වසරේදී විශ්‍රාම ගැනීමට නියමිත නිලධාරීන් සංඛ්‍යාව = 81 01.10.2019 - 31.12.2019 කාලය තුළ ලද ඉල්ලීම් සංඛ්‍යාව = 13 අඩු ලිපි ලේඛන කැඳවූ නිලධාරීන් සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන ලද නිර්දේශ සංඛ්‍යාව = 04 01.10.2019 -31.12.2019 අතර කාලය තුළ විශ්‍රාම ගත් නිලධාරීන් සංඛ්‍යාව =09	77%	ලේකම්වරු වශයෙන් සේවය කළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්ගේ විශ්‍රාම ගැනීම් සඳහා අනුමැතීන් ජනාධිපති ලේකම් කාර්යාලය මගින් දෙන ලදී.
	වාර්ෂික ස්ථාන මාරු 2020	-	-			හෞ.ඉ.			30%	30%	වාර්ෂික ස්ථාන මාරු නියෝග ප්‍රකාශයට පත් කරන ලද අතර සමාලෝචනය සඳහා අභියාචනා කැඳවන ලදී. සමාලෝචන කමිටුව 06.01.2020 දින පැවැත්වෙනු ඇත.	60%	
						මූ.ඉ.			0.006	0.00			
